චක්‍රලේඛ අංක : **2006/20**

මගේ අංකය : **ED**/01/12/10/06/01
බත්තරමුල්ල, 'ඉසුරුපාය',
අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.
2006.05.23

පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කොට්ඨාස භාර නියෝජ්‍ය / සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
රජයේ, පෞද්ගලික හා අනුමත පාසල්වල පාසල් ප්‍රධානීන් වෙත,

## පාසල්වලට ළමයින් ඇතුළත් කිරීම

පාසල්වලට (ජාතික පාසල් හා පළාත් පාසල්) ළමයින් ඇතුළත් කිරීම සම්බන්ධයෙන් මීට පෙර නිකුත් කර ඇති 2004.05.31 දිනැති අංක 2004/18 චක්‍රලේඛයේ හා එම චක්‍රලේඛයට කරන ලද යම් යම් සංශෝධනයන් ඇතුළත්ව නිකුත් කරනු ලැබ ඇති 2005.03.15 දිනැති අංක 2005/07, 2005.06.10 දිනැති අංක 2005/23 සහ 2006.01.12 දිනැති අංක 2006/02 චක්‍රලේඛ සංශෝධනයන් අභිබවා මෙම චක්‍රලේඛයේ උපදෙස් 2006.06.01 හා ඉන්පසු ව පාසල්වලට ළමයින් ඇතුළත් කිරීමේ දී බලපානු ඇත.

මෙම චක්‍රලේඛය කොටස් 05 කින් සමන්විත ය.

1. කොටස – පාසල්වලට සිසුන් ඇතුළත් කිරීමට අදාළ ජාතික ප්‍රතිපත්ති
2. කොටස – පළමු වන ශ්‍රේණියට ළමයින් ඇතුළත් කිරීම
3. කොටස – 2 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා (6 ශ්‍රේණිය හැර) පන්තිවලට සිසුන් ඇතුළත් කිරීම
4. කොටස – 6 වන ශ්‍රේණියට සිසුන් ඇතුළත් කිරීම
5. කොටස – අ.පො.ස (උසස් පෙළ) (12 ශ්‍රේණිය) පන්තිවලට සිසුන් ඇතුළත් කිරීම

## I කොටස

### පාසල්වලට සිසුන් ඇතුළත් කිරීමට අදාළ ජාතික ප්‍රතිපත්ති

1.0 පාසල්වලට සිසුන් ඇතුළත් කිරීමට අදාළ මෙම ජාතික ප්‍රතිපත්තිය අමාත්‍ය මණ්ඩලය විසින් (අමාත්‍ය මණ්ඩලයේ ලේකම්ගේ 2006.05.25 දිනැති ලිපිය මගින්) අනුමත කර ඇත. මෙම ප්‍රතිපත්තියට අනුකූලව කටයුතු කිරීමට සියලු ම දෙනා විසින් වගබලා ගත යුතුය.

1.1 පළමු වන ශ්‍රේණියට ළමයින් ඇතුළත් කිරීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය

අ. ළමයා ඇතුළත් කරන වර්ෂයේ ජනවාරි 31 දිනට වයස අවුරුදු 05 ක් සම්පූර්ණ විය යුතුය.

ආ. පාසල් ඉල්ලුම් කිරීමේදී රාජ්‍ය භාෂාවන් වන සිංහල හෝ දෙමළ භාෂාවන් සඳහා පමණක් ඉල්ලුම් කළ යුතුය

ඇ. පාසලේ ඇති පුරප්පාඩු සංඛ්‍යාවට වඩා නියමිත දිනට ලැබු අයදුම්පත් සංඛ්‍යාව වැඩි වන්නේ නම් පමණක් පහත සඳහන් ගණයන් හා ප්‍රතිශත අනුව ළමයින් තෝරා ගත යුතුය.

| | | |
|---|---|---|
| i. | ගෘහමූලිකයින්ගේ දරුවන් | 40 % |
| ii. | තත් පාසලේ ආදී සිසු/සිසුවියන් වන මව්පියන්ගේ දරුවන් | 25 % |
| iii. | එවකටත් තත් පාසලේ අධ්‍යාපනය ලබන සිසු/ සිසුවියන්ගේ සහෝදර/සහෝදරියන් | 15 % |
| iv. | ස්ථාන මාරුවීම් ලැබ පාසල පිහිටි ප්‍රදේශයේ වාසය කිරීම සඳහා පැමිණි රජයේ නිලධරයන්ගේ දරුවන් හා රාජකාරි කටයුතු නිසා තම පෞද්ගලික වාසස්ථානයෙන් බැහැරව වාසය කිරීමට සිදුවන පාර්ලිමේන්තුවට හා පළාත් සභාවලට තේරී ඇති නියෝජිතයින්ගේ දරුවන් | 06 % |
| v. | ගෘහ මූලික නොවන තැනැත්තන්ගේ දරුවන් | 07 % |
| vi. | පාසල් අධ්‍යාපනයට සෘජුවම බලපාන ආයතනවල කාර්යමණ්ඩලවලට අයත් තැනැත්තන්ගේ දරුවන් | 05 % |
| vii. | විදේශගතව සිට පැමිණි තැනැත්තන්ගේ දරුවන් | 02 % |

ඈ. ප්‍රථම සම්මුඛ පරීක්ෂණයෙන් අනතුරුව අභියාචනා හා විරෝධතා ද සලකා බැලීමෙන් පසුව පන්තියකට සිසුන් 34 ක් ද ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටින ත්‍රිවිධ හමුදාවේ හා පොලිසියේ සාමාජිකයින්ගේ දරුවන්ට ලබාදී ඇති විශේෂ අනුග්‍රහය යටතේ පන්තියකට සිසුන් 05 දෙනෙක් ද වශයෙන් පළමුවන ශ්‍රේණියේ පන්තියකට තෝරාගත හැකි උපරිම ශිෂ්‍ය සංඛ්‍යාව 39 ක් විය යුතුය.

ඉ. පළමු වන ශ්‍රේණියට ළමුන් ඇතුළත් කිරීමෙන් පසුව ද රාජ්‍ය සේවා අවශ්‍යතා මත ස්ථාන මාරුවීම් ලබ පැමිණෙන, නිලධරයන්ගේ දරුවන් සඳහා විශේෂ අනුග්‍රහයක් ලබාදීම පිණිස පන්තියකට එක් පුරප්පාඩුවක් ඉතිරිව තබාගත යුතුයි. මෙයට සුදුස්සන් ඉදිරිපත් වූවිට පරීක්ෂා කර බලා ඇතුළත් කිරීම් සිදුකරනු ඇත.

ඊ. ඉහත (ඈ) හා (ඊ) අනුව පළමු වන ශ්‍රේණියේ සමාන්තර පන්තියක අවසාන වශයෙන් සිටිය හැකි උපරිම ශිෂ්‍ය සංඛ්‍යාව 40 කි.

උ. පාසල්වල ප්‍රථම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පාසලේ විදුහල්පති විසින් පත් කරනු ලැබේ. එම මණ්ඩලයේ සංයුතිය පහත පරිදි විය යුතුය.

i. අදාළ විදුහලේ විදුහල්පති – සභාපති
ii. තම පාසලේ ප්‍රාථමික අංශයේ ප්‍රධානියා
iii. තම විදුහලේ ජ්‍යෙෂ්ට ගුරුවරුන් දෙදෙනෙකු
iv. පාසලේ සංවර්ධන සමිතියේ නියෝජිතයෙක්

(ආදී ශිෂ්‍ය පදනම මත ළමුන් තෝරා ගැනීමේ පරීක්ෂණයේදී පමණක් ආදී ශිෂ්‍ය සංගමයේ නියෝජිතයකු)

ඌ. සියලුම ගණයන් යටතේ සිසුන් තේරීමේදී නිශ්චිත ලකුණු ක්‍රමයක් භාවිතා කෙරේ.

එ. ප්‍රථම සම්මුඛ පරීක්ෂණයට ග්‍රාමසේවා නිලධාරී හා වෙනත් අයගේ සහාය අවශ්‍ය නම් ලබාගත හැකිය.

ඒ. ගණයන්වල දී ඇති නිර්ණායකවලට අනුකූලව ඒ ඒ ගණයන් සඳහා වෙන වෙනම ප්‍රථම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය මඟින් අදාළ සුදුසුකම් සලකා බලා තාවකාලික ප්‍රමුඛතා ලේඛනයක් සැකසිය යුතුය.

ඔ. එම තාවකාලික ප්‍රමුඛතා ලේඛනයට ඉදිරිපත්වන අභියාචනා හා විරෝධතා පරීක්ෂා කිරීම සඳහා අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලයක් පහත සංයුතිය අනුව පත් කෙරේ.

i. අධ්‍යාපන අමාත්‍යාංශයේ/ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ/ කලාප අධ්‍යාපන කාර්යාලයේ නියෝජිතයෙක් (සභාපති වශයෙන්)

ii. අදාළ පාසලේ ප්‍රථම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සමාජිකයෙක් නොවන නියෝජ්‍ය විදුහල්පතිවරයෙක්/ ජ්‍යෙෂ්ට ගුරුවරයෙක්
iii. ප්‍රාථමික පංති සහිත ආසන්න පාසලක විදුහල්පතිවරයෙකු

ඕ. මෙම අභියාචනා සහ විරෝධතා මණ්ඩලය මඟින් අභියාචනා හා විරෝධතා පරීක්ෂා කිරීමෙන් පසුව සකසන ලද අවසාන ලැයිස්තුවේ සිටින සියළුම ළමයින් පාසලට ඇතුළත් කරගත යුතුවේ. 1 ශ්‍රේණියට ළමුන් ඇතුළත් කිරීමේ කටයුතු අවසන් කර ජනවාරි මාසයේ පළමු සතියේ දී පළමු ශ්‍රේණියේ පන්ති විධිමත් ලෙස ආරම්භ කළ යුතුය.

1.2 2 වන ශ්‍රේණියේ සිට 11 වන ශ්‍රේණිය දක්වා (6 ශ්‍රේණිය හැර) සිසුන් ඇතුළත් කිරීම ජාතික ප්‍රතිපත්තිය

අ. 2 වන ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා (6 ශ්‍රේණිය හැර) පංතිවල පුරප්පාඩු පිරවීමේදී පහත දැක්වෙන සිසුන්ට පමණක් පාසල් ලබාදීම කළ යුතුය.

i. පෞද්ගලික වාසස්ථානයෙන් බැහැරව වාසය කිරීමට සිදුවන පාර්ලිමේන්තුවට තේරී ඇති නියෝජිතයන්ගේ දරුවන්
ii. ස්ථාන මාරුවීම් ලැබ පාසල පිහිටි ප්‍රදේශයේ වාසය කිරීම සඳහා පැමිණෙන රජයේ නිලධරයන්ගේ/ සංස්ථා සේවකයන්ගේ/ රාජ්‍ය බැංකු නිලධරයන්ගේ දරුවන්
iii. විදේශයන්හි දෙවර්ෂයකට වැඩි කාලයක් මව, පියා, හා දරුවා පදිංචිව සිට ආපසු පැමිණෙන ශ්‍රී ලංකිකයන්ගේ දරුවන්
iv. පාසල පිහිටි ප්‍රදේශයකට සැබැවින්ම තම ස්ථිර වාසස්ථානය වෙනස් කර පැමිණි මව්පියන්/ නීත්‍යානුකූල භාරකරුවන්ගේ දරුවන්.

ආ. ඝ. 2 වන ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණිය දක්වා එක් පංතියක ශිෂ්‍ය සංඛ්‍යාව 40 කට සීමා කළ යුතු අතර දැනටමත් එම පංතිවල සිසුන් සංඛ්‍යාව 40 හෝ 40 ඉක්මවා සිටි නම් එම පංතිවලට අලුතින් සිසුන් ඇතුළත් නොකළ යුතුය.

ඍඍ. 6 වන ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා එක් පංතියක ශිෂ්‍ය සංඛ්‍යාව 45කට සීමා කළ යුතු අතර දැනටමත් එම පංතිවල සිසුන් සංඛ්‍යාව 45 හෝ 45 ඉක්මවා තිබේ නම් එම පංතිවලට අලුතින් සිසුන් ඇතුළත් නොකළ යුතුය.

1.3 6 ශ්‍රේණියට ළමයින් ඇතුළත් කිරීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය

අ. තම පාසලේම සිසුන්,පෝෂිත පාසල්වලින් ඇතුළත්වන සිසුන් හා 5 ශ්‍රේණී ශිෂ්‍යත්ව විභාගයෙන් සුදුසුකම් ලබන සිසුන් මඟින් 6 ශ්‍රේණියේ පුරප්පාඩු පුරවනු ලැබේ.

ආ. I. පස්වැනි ශ්‍රේණි ශිෂ්‍යත්වධාරීන් ඇතුළත් කරනු ලබන පාසල්වල, එකී ශිෂ්‍යත්වධාරීන් ඇතුළත් කිරීමෙන් පසුව හා නම් කරන ලද පෝෂිත පාසල්වල ළමයින් ඇතුළත් කිරීමෙන් පසුව 6 වැනි ශ්‍රේණියේ තවදුරටත් ඇබෑර්තු තිබේ නම්, එකී ඇබෑර්තු පිරවීම සඳහා විදුහල්පති විසින් ඉල්ලුම්පත් කැඳවීම කළ යුතු ය. පාසලට ඉදිරිපත් කෙරෙන ඉල්ලුම්පත් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් පවත්වනු ලද අදාළ වර්ෂයේ 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගයේ දී ඒ ඒ සිසුන් ලබාගත් ලකුණු ප්‍රමුඛතා අනු පිළිවෙලට පෙළ ගස්වා ඇබෑර්තු සංඛ්‍යාව ද පැහැදිලිව සඳහන් කොට පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගේ (ජාතික පාසලක් නම් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මඟින් මෙම අමාත්‍යාංශයේ පාසල් කටයුතු ශාඛාවේ අධ්‍යාපන අධ්‍යක්ෂගේ) අනුමැතිය වාර්ෂිකව ලබා ගත යුතු ය.

II. ප්‍රාථමික අංශය නොමැති නම් හා නම් කරන ලද පෝෂිත පාසල් නොමැති කල්හි ආදී ශිෂ්‍ය/ ශිෂ්‍යාවන්ගේ දරුවන්ට හා අදාළ පාසලේ දැනට අධ්‍යාපනය ලබන සිසුන්ගේ සහෝදර සහෝදරියන්ගේ සිසුන්හට හා අධ්‍යාපන කලාපය තුළ පාසලේ අධ්‍යාපනයට සෘජුවම බලපාන ආයතනවල සේවය කරන කාර්යමණ්ඩලවල අයගේ දරුවන්ට අනුග්‍රහයක් ලෙස කණ්ඩායම් 03 ටම හය ශ්‍රේණියට ඇතුළත්වීම සඳහා පාසලේ පුරප්පාඩුවලින් 15% ක් ලබාදිය යුතුය. (මෙය ආදී ශිෂ්‍ය/ ශිෂ්‍යාවන්ගේ දරුවන් 7.5% ක් ද දැනට එම පාසලේ අධ්‍යාපනය ලබන සිසු/ සිසුවියන්ගේ සහෝදර/ සහෝදරියන්ට 5% ක් ද අධ්‍යාපන කලාපය තුළ පාසල් අධ්‍යාපනයට සෘජුවම බලපාන ආයතනවල සේවය කරන කාර්ය මණ්ඩලවලට අයත් තැනැත්තන්ගේ දරුවන් 2.5% ද වශයෙන් විය යුතුයි).

1.4 අ.පො.ස. (උසස් පෙළ) 12 ශ්‍රේණියේ පංතිවලට සිසුන් ඇතුළත් කිරීමේ ජාතික ප්‍රතිපත්තිය

අ. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙ.) විභාගයේ දී මාධ්‍ය භාෂාව හා ගණිතය ඇතුළු හර විෂයයන් 6 කින් සමත් විය යුතු අතර, ඉන් අවම වශයෙන් විෂයයන් තුනකට සම්මාන සාමාර්ථය ලබා තිබිය යුතු ය. ඉහත සඳහන් සුදුසුකම් සපුරාලීම සඳහා අතිරේක විෂයයන්ගෙන් ලබන සමාර්ථ හෝ සම්මාන සමාර්ථ හෝ යොදා ගත නොහැකිය.

ආ. අ.පො.ස. (උසස් පෙළ) ට ඇතුළත්වීම සඳහා අවශ්‍ය වන සම්මාන සමාර්ථ 03 න් එකක් නොමැති අවස්ථාවක දී ලිඛිත විභාගයෙන් සාමාන්‍ය සමාර්ථයක් ලබා පාසල් පදනම් කරගත් ඇගයීම් යටතේ සම්මානයක් හෝ ඊට ඉහළ සමාර්ථයක් ඇත්නම් එක් සම්මාන සාමාර්ථයක් ලෙස සැලකිය යුතුය. මෙය ගණිතය හා භාෂා විෂයයට අදාළ නොවේ.

ඇ. එක් එක් විෂයධාරාවන් සඳහා අවම සුදුසුකම් සපුරාලන තම පාසලේ සිසුන් ඇතුළත් කිරීමෙන් පසු අනෙකුත් පාසල්වල ළමයින් ඇතුළත් කරගත යුතුයි.

ඈ. අ.පො.ස. (උසස් පෙළ) පංතියක රැදී සිටිය හැකි උපරිම කාල සීමාව අවු 03 කි.

ඉ. පහසුකම් සහිත දිස්ත්‍රික්කයෙන් දුෂ්කර දිස්ත්‍රික්කයට අ.පො.ස. (උසස් පෙළ) ඇතුළත්වීමට අපේක්ෂා කරන සිසුන් ඇත්ත වශයෙන්ම පදිංචිය වෙනස් කර තිබිය යුතුයි.

1.5 ළමයින් ඇතුළත් කිරීම සඳහා මුදල් සහ වෙනත් ආධාර ලබා ගැනීම තහනම් කිරීම.

සියලුම රජයේ පාසල් හා ගාස්තු අය නොකරන පෞද්ගලික පාසල්වලට ළමයින් ඇතුළත් කිරීමේ දී පහසුකම් හා සේවා ගාස්තු සහ පාසල් සංවර්ධන සමිති සාමාජික මුදල හැර වෙනත් ගාස්තු හෝ ආධාර මුදල් හෝ වෙනයම් බඩු බාහිරාදියක් හෝ අයකිරීම්/ලබාගැනීම් සම්පූර්ණයෙන් ම තහනම් වේ. ළමයින් ඇතුළත් කිරීමෙන් පසුව ද එවැනි බලපෑමක් නොකළ යුතු වේ. මෙලෙස බලපෑම් කිරීම සම්පූර්ණයෙන් ම විනය විරෝධී වන අතර ඒ සම්බන්ධ ව දැඩි ලෙස ක්‍රියා කිරීමට සිදු වනු ඇත. පාසල් ප්‍රධානීන් හෝ පාසලට සම්බන්ධ වෙනත් කවර සංවිධානයක් හෝ එලෙස බලපෑම් නොකළ යුතු ය. මෙහි දී සංවිධාන යන්නෙන් ආදි ශිෂ්‍ය සංගම්, පාසල් සංවර්ධන සමිති ඇතුළු පාසලට සම්බන්ධ වු සියලු ම සමිති හා සංගම් අදහස් කෙරේ.

## **II** කොටස

## පළමුවන ශ්‍රේණියට ළමයින් ඇතුළත් කිරීම

**2.0** ළමයින් ඇතුළත් කිරීම සඳහා මූලික සුදුසුකම් :

2.1 ළමයා ඇතුළත් කරන වර්ෂයේ, ජනවාරි 31 දිනට අවම වයස අවුරුදු පහක් සම්පූර්ණ විය යුතු ය. මේ සඳහා උප්පැන්න සහතිකය ඉදිරිපත් කළ යුතු ය. උප්පැන්න සහතිකයේ පිටපතක් ලබා ගන්නා තුරු බී-34 ආකෘතියේ නිකුත් කර ඇති උපත් ලේඛනයේ උධෘතයක් තාවකාලික ව පිළිගත හැකි ය. (පාසලේ ඇති පුරප්පාඩු සංඛ්‍යාවට ප්‍රමාණවත් නොවන අයදුම්පත් සංඛ්‍යාවක් ලැබී ඇති අවස්ථාවක පමණක් ළමයකුට උප්පැන්න සහතිකය නොමැති නම් ඒ වෙනුවට උපන් දිනය සනාථ කිරීමට දිවුරුම් ප්‍රකාශයක් පිළිගත හැකි ය)

2.2 ජනවාරි 31 දිනට වයස අවුරුදු 6 ට වැඩි ළමයින් ඇතුළත් කළ හැක්කේ වයස අවුරුදු 6 ට අඩු සුදුසුකම් ඇති ළමයින් සියලු දෙනා ම ඇතුළත් කර ගැනීමෙන් පසුව ය.

2.3 මව්පියන් පදිංචි ව සිටින්නේ එක ම ස්ථානයක නොවන කල්හි ඔවුන් නිතීයෙන් වෙන් නොවූ අය නම් ඒ අය නීතියෙන් වෙන් වීම සඳහා දැනටමත් ගෙන ඇති ක්‍රියාමාර්ග සනාථ කර ඇති විට ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කර ඇති අයගේ (පියා හෝ මව) පදිංචි ස්ථානය, ළමයා පදිංචි ස්ථානය වශයෙන් සලකනු ලැබේ.

2.4 ළමයකු පළමු වන ශ්‍රේණියට ඇතුළත් කිරීමේ දී උසාවි තීන්දුවකින් නිත්‍යානුකූල භාරකාරත්වය ලැබූ පුද්ගලයකු පමණක් භාරකරු වශයෙන් පිළිගනු ලැබේ.

2.5 මව/පියා/නිත්‍යානුකූල භාරකරුගේ වාසස්ථානයේ සිට ළමයා ඇතුළත් කිරීම සඳහා ඉල්ලුම් කරන පාසලට ඇති ආසන්නතාව සැලකිල්ලට ගන්නා ගණයන් සඳහා ආසන්නතාව ගණනය කළ යුත්තේ තත් පාසලේ කාර්යාල සීමාවේ සිට ය. වෙනත් භූමියක ප්‍රාථමික අංශය වෙන් ව පිහිටා ඇති විටෙක ආසන්නතාව ගණනය කළ යුත්තේ ප්‍රාථමික අංශයේ කාර්යාල සීමාවේ සිට ය.

2.6 රජයේ, පෞද්ගලික හෝ අනුමත පාසලකට පෙර වර්ෂයක දී ඇතුළත් කර ඇති ළමයකු නැවත වරක් පළමු වන ශ්‍රේණිය සඳහා ඇතුළත් කිරීමට සුදුසු නොවන්නේ ය.

**3.0** ළමයින් ඇතුළත් කිරීම සඳහා අයදුම් කිරීමේ කාර්යය පටිපාටිය :

3.1 සෑම වර්ෂයක ම මැයි මාසයේ අග සතියේ දී හෝ ජුනි මාසයේ මුල් සතියේ දී ඊළඟ වර්ෂය සඳහා පළමු වන ශ්‍රේණියට ළමයින් ඇතුළත් කිරීමට බලාපොරොත්තු වන මව්පියන්ගෙන් හෝ නිත්‍යානුකූල භාරකරුවන්ගෙන් අයදුම්පත් කැඳවන දැන්වීම ප්‍රවෘත්ති පත්‍රවල පළ කරනු ඇත.

3.2 වසර ආරම්භයේ දී පාසලේ පෝෂිත ප්‍රදේශයේ ඡන්ද නාමලේඛනය විදුහල්පති විසින් ලබාගෙන ඒ අනුව ප්‍රදේශයේ සත්‍ය වශයෙන් ම පදිංචි ව සිටින අයගේ නාමලේඛනයක් වසරින් වසර පිළියෙල කර ගත යුතු අතර පසුගිය වසරවල දී එම පදිංචි ස්ථානයෙන් ම පළමු ශ්‍රේණියට ළමයින් ඇතුළත් කර ඇත්ද යන විස්තර ද මෙම ලේඛනයට ඇතුළත් කළ යුතු ය. (නියමිත සංඛ්‍යාවට වඩා වැඩි ඉල්ලුම්පත් සංඛ්‍යාවක් ලබන පාසල් සඳහා පමණි)

3.3 මව්පියන් හෝ නිත්‍යානුකූල භාරකරුවන් තමන්ගේ ස්ථිර පදිංචි ස්ථානයට ආසන්නතම පාසලේ ප්‍රධානියා වෙත අදාළ වර්ෂයේ ජුනි 30 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු අතර ඒ සමග නම, ලිපිනය සඳහන් ලියාපදිංචි තැපැල සඳහා අවශ්‍ය මුද්දර සහිත ලියුම් කවරයක් ද පදිංචිය සනාථ කිරීම සඳහා තමාගේ හිමිකම් ඔප්පුවේ හෝ හිමිකම් පිළිබඳ ප්‍රධාන ලේඛණයේ හා ළමයාගේ උප්පැන්න සහතිකයේ තමා විසින් ම සහතික කළ පිටපත් ද එවිය යුතු යි. අතින් භාර දෙන්නේ නම් භාර ගත් බවට ලදුපතක් ලබා ගත යුතු යි. ජාතික පාසලකට ඉල්ලුම් කරන්නේ නම් තමාට ඉල්ලුම් කිරීමට සුදුසුකම් ඇති පළාත් පාසල්වලට ද අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ය. එසේ ම තම දරුවාගේ සහෝදර සහෝදරියන් ද දැනටමත් ඉගෙන ගන්නා පාසලට හෝ තමන් ආදි ශිෂ්‍යයකු/ශිෂ්‍යාවක වන පාසලකට හෝ ළමයා ඇතුළත් කිරීමට බලාපොරොත්තු වන්නේ නම් එම පාසලට ද අයදුම්පත් ඉදිරිපත් කළ හැකි ය.

3.4 මාධ්‍ය දෙකක් ඇති පාසල්වලට ඉල්ලුම් කිරීමේ දි ඉල්ලුම් කළ හැක්කේ එක් මාධ්‍යයකට පමණි.

3.5 අයදුම්පත් විදුහල්පති විසින් ලබා ගත යුත්තේ ප්‍රවෘත්ති පත්‍රවල පළ කරනු ලබන මෙම චක්‍රලේඛයේ අංක 01 උපලේඛනයේ සඳහන් ආකෘති පත්‍රය අනුව ය.

**4.0** තෝරා ගැනීමේ කාර්යය පටිපාටිය :

4.1 <u>නියමිත දිනට ලැබූ අයදුම්පත් සංඛ්‍යාව පාසලේ ඇති පුරප්පාඩු සංඛ්‍යාවට වඩා වැඩි වන්නේ නම් පමණක්</u> ඇතුළත් කර ගැනීමට සුදුසු ළමයින් තෝරා ගැනීම සඳහා පාසල් ප්‍රධානියා විසින් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් ස්ථාපනය කළ යුතු ය. මෙම මණ්ඩලයේ ප්‍රධානියා පාසලේ විදුහල්පති හෝ නියෝජ්‍ය විදුහල්පතිවරයකු විය යුතු අතර ප්‍රාථමික අංශයේ ප්‍රධානියා ද තවත් ජ්‍යෙෂ්ඨ ගුරුවරු/ගුරුවරියන් දෙදෙනෙක් ද, පාසල් සංවර්ධන සමිතියේ නියෝජිතයකු ද මෙම මණ්ඩලයට ඇතුළත් විය යුතු ය. ජ්‍යෙෂ්ඨ ගුරුවරු/ ගුරුවරියන් තේරීමේ දී ශ්‍රී.ලං.අ.ප.සේ හා/හෝ විදුහල්පති සේවයේ ශ්‍රේණිධාරීන් පාසලේ සිටී නම් ඒ අය ඇතුළත් කළ යුතු යි.

4.2 ජාතික පාසල් සම්බන්ධයෙන් නම් ජාතික පාසල් අධ්‍යාපන අධ්‍යක්ෂගේ නියෝජිතයකු ද පළාත් පාසල් සම්බන්ධයෙන් නම් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ නියෝජිතයකු ද විදුහල්පතිගේ ඉල්ලීම මත අවශ්‍ය වූ අවස්ථාවන්හි දී මෙම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට සහභාගි කරවගත හැකි ය.

4.3 ආදි ශිෂ්‍ය පදනම මත ළමයින් තෝරා ගැනීමේ පරීක්ෂණයේ දී පමණක් ආදී ශිෂ්‍ය සංගමයේ නියෝජිතයකු ද එම මණ්ඩලයට ඇතුළත් කළ යුතු ය.

4.4 ගෘහ මූලික හා ගෘහ මූලික නොවන ගණයන් හි ළමයින් තෝරා ගැනිමේ දී පදිංචිය තවදුරටත් සනාථ කිරීම සඳහා පමණක් අදාළ ග්‍රාමසේවා වසමේ ග්‍රාමසේවා නිලධරයාගේ ද පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියගේ ද සහාය ලබාගත හැකිය.

4.5 මෙම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයන් අතරින් විදුහල්පති හා ප්‍රාථමික අංශභාර ප්‍රධානියා හැර අනෙකුත් සියලුම සාමාජිකයන් එනම් ජ්‍යෙෂ්ඨ ගුරු භවතුන් පාසල් සංවර්ධන සමිති නියෝජිතයින්, ආදී ශිෂ්‍ය නියෝජිතයන් අනිවාර්යයෙන් ම වාර්ෂික ව වෙනස් විය යුතු යි.

4.6 ඉල්ලුම් පත්‍ර ලැබුණු විගස පරීක්ෂා කිරීමේ දී ඉල්ලුම්කරුවන් පැහැදිලි ව ම ඇතුළත් කිරීමට අවශ්‍ය මූලික සුදුසුකම්වලින් බැහැර වන්නේ නම් ඔවුන් සම්මුඛ පරීක්ෂණය සඳහා නොකැඳවිය හැකි ය. එහෙත් මේ අය සම්බන්ධයෙන් සම්මුඛ පරීක්ෂණය සඳහා නොකැඳවීමේ හේතු පැහැදිලි ව ම සඳහන් කර ඒ බව ලිපියකින් සම්මුඛ පරීක්ෂණ ආරම්භ කිරීමට පෙර ඉල්ලුම්කරුවන්ට දන්වා යැවිය යුතු ය.

4.7 ඇතුළත් කිරීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ කටයුතු, විවෘත ව හා විනිවිද භාවයෙන් යුක්ත ව පැවැත්විය යුතු ය.

4.8 විදුහල්පති විසින් ඉල්ලුම්පත් කැඳවන අවසාන දිනයෙන් පසු සති 02ක් ඇතුළත ඉල්ලුම්පත් ඉදිරිපත් කළ දෙමාපියන්/ භාරකරුවන් රැස්වීමකට කැඳවා ළමයින් ඇතුළත් කිරීමේ කාර්ය පටිපාටිය පිළිබඳව දැනුවත් කළ යුතු ය. එම රැස්වීම සඳහා ජාතික පාසලක් නම් අධ්‍යාපන අමාත්‍යාංශයේ නියෝජිතයකු ද පළාත් පාසලක් නම් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ නියෝජිතයකු ද අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ට/ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකට/ විදුහල්පතිට, අවශ්‍ය වූ අවස්ථාවන් හි දී සහභාගි කරවිය හැකි ය.

5.0 තෝරා ගැනීමේ ගණයන් හා ඒවාට අදාළ ප්‍රතිශත :

(අ) 1960 අංක 05 හා 1961 අංක 08 යන පනත් අනුව රජයට පවරා ගන්නා ලද පාසල්වල පුරප්පාඩු පිරවීමේ දී පවරා ගන්නා අවස්ථාවේ තත් පාසලේ සිටි ආගමික සිසු අනුපාතය ගැන සැලකිල්ලට ගෙන පුරප්පාඩු සංඛ්‍යාව ආගම් අනුව හා පහත සඳහන් එක් එක් ගණයන් සඳහා බෙදා වෙන් කළ යුතු ය. යම් ආගමක එක් ගණයකට වෙන් කරන ලද ප්‍රමාණයට අඩු අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඇති කල් හි එම පුරප්පාඩු එම ආගමට අයත් සෙසු ගණයන් අතර අනුපාතික ව බෙදා හැරිය යුතු ය. යම් ආගමකට අයත් අයදුම්කරුවන් නොමැති විට ඒවා අනුපාතික ව අනිකුත් ආගම් අතර බෙදා හැරිය යුතු ය.

(ආ) යම් පාසලක පළමු වන ශ්‍රේණියේ පවත්නා පුරප්පාඩු විශේෂ අනුග්‍රහයන්ට වෙන් කිරීමෙන් අනතුරුව මෙහි දැක්වෙන ප්‍රතිශත අනුව පහත සඳහන් ගණයන්ට අයත් ළමයින් අතරින් පිරවිය යුතු ය.

| | | |
|---|---|---|
| I. | ගෘහ මූලිකයන්ගේ දරුවන් | 40% |
| II. | තත් පාසලේ ආදි සිසු/සිසුවියන් වන මව්පියන්ගේ දරුවන් | 25% |
| III. | එවකටත් තත් පාසලේ අධ්‍යාපනය ලබන සිසු/ සිසුවියන්ගේ සහෝදර /සහෝදරියන් | 15% |
| IV. | ස්ථාන මාරුවීම් ලැබ පාසල පිහිටි ප්‍රදේශයේ වාසය කිරීම සඳහා පැමිණි රජයේ නිලධරයන්ගේ දරුවන් හා රාජකාරි කටයුතු නිසා තම පෞද්ගලික වාසස්ථානයෙන් බැහැර ව වාසය කිරීමට සිදුවන පාර්ලිමේන්තුවට හා පළාත් සභාවලට තේරී ඇති නියෝජිතයන්ගේ දරුවන් | 06% |
| V. | ගෘහ මූලික නොවන තැනැත්තන්ගේ දරුවන් | 07% |
| VI. | පාසල් අධ්‍යාපනයට සෘජු ව ම බලපාන ආයතනවල කාර්ය මණ්ඩලවලට අයත් තැනැත්තන්ගේ දරුවන් | 05% |
| VII. | විදේශගත ව සිට පැමිණි තැනැත්තන්ගේ දරුවන් | 02% |

ඉහත දක්වා ඇති ඒ ඒ ගණයන්වලට අයත්වීමට පහත සඳහන් අවශ්‍යතා සපුරා තිබිය යුතුය.

5.1 ගෘහ මූලිකයන්ගේ දරුවන් – 40%

(අ) මෙම ගණය යටතේ ඉල්ලුම්කල හැක්කේ :

i. පාසල සමීපයේ ස්ථිර ව ම පදිංචිව සිටින අයගේ ළමයින්

ii. පාසල සමීපයේ ආවාහ විවාහ වීමෙන් පසුව තම මාපියන්ගේ නිවසේ ස්ථිරව පදිංචි ව සිටින අයගේ ළමයින් (දරුවා, මව හා පියා සත්‍ය වශයෙන්ම අඛණ්ඩ ව පදිංචි ව සිටිය යුතුය. මව හෝ පියා විදේශගත ව සිටියේ නම් එසේ විදේශගත වූ කාලය අඛණ්ඩ පදිංචි කාලය තුළ ගණන් ගනු ලබයි.)

iii. පාසලට සමීපයේ රජයේ නිල නිවාසයක පදිංචිව සිටින අයගේ ළමයින් (රජයේ නිල නිවාසය භාරගත් නිලධරයාගේ දරුවන්ට පමණක්)

(ආ) මෙම ගණය සඳහා ළමයින් තෝරා ගැනීමේ දී පහත සඳහන් කරුණු සැලකිල්ලට ගැනේ. මේ තුළින් අපේක්ෂා කරනුයේ පාසලට සමීපතම අවු. 6ක් හෝ ඊට වැඩි ස්ථිර අඛණ්ඩ පදිංචිකරුවන්ගේ දරුවන් සඳහා ප්‍රමුඛත්වය ලබාදීමට ය.

i. ස්ථිර පදිංචි ස්ථානයේ හිමිකම

ii. එම ස්ථිර පදිංචි ස්ථානයේ පදිංචිව සිටි කාලය

iii. පදිංචි නිවසේ සිට පාසලට ඇති දුර

(ඇ) ස්ථිර පදිංචි සථානයේ හිමිකම :

දෙමාපියන් හෝ නීත්‍යානුකූල භාරකරුවන් තමන්ගේ ස්ථිර පදිංචිය පහත සඳහන් ලේඛනයක් මඟින් සනාථ කළ යුතු ය.

i. සින්නක්කර ඔප්පුව

ii. කුටුම්භ සහතිකය

iii. නිවාස සංවර්ධන අධිකාරිය වැනි රජයේ ආයතන විසින් ලබා දී ඇති බලපත්‍රය

iv. ආවාහ විවාහ වීමෙන් පසුව තම මාපියන් නිවසේ ස්ථිර පදිංචි ව සිටිනම් මාපියන්ගේ සින්නක්කර ඔප්පුව හා දෙමාපියන්ගෙන් පදිංචි බවට ලබාගත් ප්‍රකාශයක්

v. රජයේ නිල නිවාසයක පදිංචි වී සිටි නම් ආයතන ප්‍රධානියා විසින් බලය පවරන ලද ලිපිය හා අවුරුදු 6ක, කුලී මාසිකව වැටුපෙන් අයකරගත් බවට තහවුරු කරන ලේඛන

vi. පිළිගත හැකි වෙනත් ලේඛන

(දෙමව්පියන් විසින් ඉහත ලේඛණයක තමා විසින්ම සහතික කල පිටපතක් ඉල්ලුම්පත සමඟ එවිය යුතුය.)

(ඈ) පදිංචි කාලය තහවුරු කිරීම

ඉහත (ආ) 1 සනාථ වූ අයදුම්කරුවන් එම ස්ථානයෙහි ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට අවුරුදු 06 ක් හෝ ඊට වැඩි කාලයක් අඛණ්ඩ ව පදිංචි ව සිටින බව සනාථ කළ යුතුවේ. මෙහි දී එම කාලය තුළ ස්ථාන කිහිපයක පදිංචි වී සිටි නම් විදුහලට වඩාත් ම දුර ස්ථානය අවුරුදු 06 සඳහා ම පදිංචි ස්ථානය ලෙස සැලකේ.

(ඉ) පදිංචි ස්ථානයේ සිට පාසලට ඇති දුර :

පදිංචිය සනාථ කෙරෙන ස්ථානයේ සිට පාසලට ඇති අවම දුර අනුව අයදුම්කරුවන්ට ප්‍රමුඛත්වය හිමිවේ. මෙහි දී ඒ ඒ පාසල් වෙත ලැබී ඇති ඉල්ලුම්පත් හා පසුගිය අවුරුදුවල දී තීරණය කරනු ලැබූ දුර ප්‍රමාණයන් ද සැලකිල්ලට ගෙන දුර සීමාවන් තීරණය කළ යුතු වේ. දුර ප්‍රමාණය පාසලින් පාසලට වෙනස් විය හැකි ය.

(ඊ) අවු. 06ක් හෝ ඊට වැඩි ස්ථිර පදිංචිය ඇති අය ලකුණු ක්‍රමය අනුව තෝරා ගැනීමෙන් පසුව තවදුරටත් ඇබෑර්තු තිබේ නම් අවු. 05, 04 ආදී වශයෙන් දීර්ඝතම කාලයක් පදිංචිය ඔප්පු කර ඇති අය අතුරින් එම ඇබෑර්තු පිරවිය යුතු ය.

(උ) මෙහි දී තෝරා ගැනීම් මෙම චක්‍රලේඛයේ අංක 02 උපලේඛනයේ දැක්වෙන ලකුණු ක්‍රමය අනුව විය යුතුය. මෙම ලකුණු ක්‍රමය සම්මුඛ පරීක්ෂණ ආරම්භ කිරීමට සතියකට පෙර පාසල් දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනය කළ යුතු ය. මෙම ලකුණු ක්‍රමය අනුගමනය කළ යුත්තේ ස්ථිර පදිංචිය සනාථ වුයේ නම් පමණී.

5.2 තත් පාසලේ ආදි සිසු/සිසුවියන් වන මව්පියන්ගේ දරුවන් - 25%

(අ) මෙම ගණයේ ළමයින් තෝරා ගැනීමේ පදනම වනුයේ, ඒ ඒ ළමයාගේ මව්පියන් /නිත්‍යානුකූල භාරකරු ඒ පාසලේ ආදි ශිෂ්‍ය/ශිෂ්‍යාවන් වීම යි.

(ආ) මෙම චක්‍රලේඛයේ අංක 03 උප ලේඛනයක් වශයෙන් දැක්වෙන ලකුණු ක්‍රමය මෙම ගණයේ ළමයින් තෝරා ගැනීම සඳහා උපයෝගි කර ගත යුතු යි. මෙම ලකුණු ක්‍රමය සම්මුඛ පරීක්ෂණ ආරම්භ කිරීමට සතියකට පෙර පාසල් දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනය කළ යුතු යි.

5.3 එවකටත් තත් පාසලේ අධ්‍යාපනය ලබන සිසු/සිසුවියන්ගේ සහෝදර /සහෝදරියන් - 15%

(අ) මෙම ගණයේ ළමයින් තෝරා ගැනීමේ පදනම වනුයේ ළමයාගේ මව්පියන්ගේ/නිත්‍යනුකූල භාරකරුගේ ස්ථිර වාසස්ථානය සහ ආසන්නතාව පිළිබඳ නියමය ප්‍රධාන කොට සළකා ඒ මව්පියන්ගේ වැඩිමහල් ළමයින් දැනටමත් ඒ පාසලේ ඉගෙනුම ලබමින් සිටීම ය.

(ආ) මෙහි දී තෝරා ගැනීම් මෙම චක්‍රලේඛයේ අංක 04 උපලේඛණයේ දැක්වෙන ලකුණු ක්‍රමය අනුව විය යුතුයි. මෙම ලකුණු ක්‍රමය සම්මුඛ පරීක්ෂණ ආරම්භ කිරීමට සතියකට පෙර පාසල් දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනය කළ යුතු ය.

**5.4** ස්ථාන මාරුවීම් ලැබ පාසල පිහිටි ප්‍රදේශයේ වාසය කිරීම සඳහා පැමිණි රජයේ නිලධරයන්ගේ දරුවන් සහ රාජකාරී කටයුතු නිසා තම පෞද්ගලික වාසස්ථානයෙන් බැහැර ව වාසය කිරීමට සිදුවන පාර්ලිමේන්තුවට හා පළාත් සභාවලට තේරී ඇති නියෝජිතයන්ගේ දරුවන් - 06%

(අ) මෙම ගණයේ ළමයින් තෝරා ගැනීමේ පදනම වනුයේ, යම් රජයේ නිලධරයෙකුගේ/සංස්ථා නිලධරයකුගේ/ රාජ්‍ය බැංකු නිලධරයෙකුගේ ඉල්ලීම මත නොව රජයේ/ ආයතනයේ අවශ්‍යතාව මත පාසල පිහිටි ප්‍රදේශයට රජයේ නිලධරයන් /සංස්ථා නිලධරයන් /රාජ්‍ය බැංකු නිලධරයන් ස්ථාන මාරු ලැබ පැමිණීම ය.

(ආ) ස්ථාන මාරුවීම, ළමයින් ඇතුළත් කිරීම සඳහා ඉල්ලුම්පත්‍ර කැඳවනු ලබන වසරේ ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට පෙරාතුව වු වර්ෂ 04ක් ඇතුළත සිදු වී තිබිය යුතු ය.

(ඇ) අධ්‍යයන කටයුතු හෝ පුහුණු කටයුතු වැනි අනුයුක්ත කිරීම් හෝ නිදහස් කිරීම් ආදිය මෙම ගණයෙහි ලා නොසැලකිමට විදුහල්පතිවරුන් වගබලා ගත යුතු ය.

(ඈ) මෙහි දී තෝරා ගැනිම් මෙම චක්‍රලේඛයේ අංක 05 උපලේඛනයේ දක්වන ලකුණු ක්‍රමය අනුව විය යුතුය. මෙම ලකුණු ක්‍රමය සම්මුඛ පරීක්ෂණ ආරම්භ කිරීමට සතියකට පෙර පාසල් දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනය කළ යුතු ය.

**5.5** ගෘහ මූලික නොවන තැනැත්තන්ගේ දරුවන් - 07%

(අ) මෙම ගණය යටතේ ඉල්ලුම්කල හැක්කේ පාසල සමීපයේ ස්ථිර ව ම පදිංචි ව සිටින අයට පමණි.

(ආ) මෙම ගණය සඳහා ළමයින් ඇතුළත් කිරීමේ දී පහත සඳහන් කරුණු සැලකිල්ලට ගැනේ. මේ තුළින් අපේක්ෂා කරනුයේ පාසලට සමීපතම අවු. 6ක් හෝ ඊට වැඩි ස්ථිර අඛණ්ඩ පදිංචිකරුවන්ගේ දරුවන් සඳහා ප්‍රමුඛත්වය ලබාදීමට ය.

i. ස්ථිර පදිංචි ස්ථානයේ හිමිකම
ii. එම ස්ථිර පදිංචි ස්ථානයේ පදිංචිව සිටි කාලය
iii. පදිංචි නිවසේ සිට පාසලට ඇති දුර

(ඇ) ස්ථිර පදිංචි සථානයේ හිමිකම :

දෙමාපියන් හෝ නීත්‍යානුකූල භාරකරුවන් තමන්ගේ ස්ථිර පදිංචිය පහත සඳහන් ලේඛනයක් මගින් සනාථ කළ යුතු ය.

i. බදු ඔප්පුව

ii. බදු ගිවිසුම/ කල් බදු ගිවිසුම
iii. පිළිගත හැකි වෙනත් ලේඛන

(දෙමව්පියන් විසින් ඉහත ලේඛණයක තමා විසින්ම සහතික කල පිටපතක් ඉල්ලුම්පත සමග එවිය යුතුය.)

(ඇ) පදිංචි කාලය තහවුරු කිරීම

ඉහත (ආ) 1 සනාථ වූ අයදුම්කරුවන් එම ස්ථානයෙහි ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට අවුරුදු 06 ක් හෝ ඊට වැඩි කාලයක් අඛණ්ඩ ව පදිංචි ව සිටින බව සනාථ කළ යුතු වේ. මෙහි දී එම කාලය තුළ ස්ථාන කිහිපයක පදිංචි වී සිටි නම් විදුහලට වඩාත් ම දුර ස්ථානය අවුරුදු 06 සඳහා ම පදිංචි ස්ථානය ලෙස සැලකේ.

(ඉ) පදිංචි ස්ථානයේ සිට පාසලට ඇති දුර :

පදිංචිය සනාථ කෙරෙන ස්ථානයේ සිට පාසලට ඇති අවම දුර අනුව අයදුම්කරුවන්ට ප්‍රමුඛත්වය හිමිවේ. මෙහි දී ඒ ඒ පාසල් වෙත ලැබී ඇති ඉල්ලුම්පත් හා පසුගිය අවුරුදුවල දී තීරණය කරනු ලැබූ දුර ප්‍රමාණයන් සැලකිල්ලට ගෙන දුර සීමාවන් තීරණය කළ යුතු වේ. දුර ප්‍රමාණය පාසලින් පාසලට වෙනස් විය හැකි ය.

(ඊ) අවු. 06 ක් හෝ ඊට වැඩි ස්ථිර පදිංචිය ඇති අය ලකුණු ක්‍රමය අනුව තෝරා ගැනීමෙන් පසුව තවදුරටත් ඇබෑර්තු තිබේ නම් අවු. 05, 04 ආදී වශයෙන් දීර්ඝතම කාලයක් පදිංචිය ඔප්පු කර ඇති අය අතුරින් එම ඇබෑර්තු පිරවිය යුතුය.

(උ) මෙම චක්‍රලේඛයේ අංක 06 දරණ උපලේඛනයේ දැක්වෙන ලකුණු ක්‍රමය අනුව තෝරා ගැනීම් සිදු කළ යුතු ය. මෙම ලකුණු ක්‍රමය ද සම්මුඛ පරීක්ෂණ ආරම්භ කිරීමට සතියකට පෙර පාසල් දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනය කළ යුතු ය.

**5.6 පාසල් අධ්‍යාපනයට සෘජු ව ම බලපාන ආයතනවල කාර්ය මණ්ඩලවලට අයත් තැනැත්තන්ගේ දරුවන් 05%**

(අ) මෙම ගණයේ ළමයින් තෝරා ගැනීමේ පදනම වනුයේ පාසල් අධ්‍යාපනයට සෘජු ව ම බලපාන ආයතනවල කාර්ය මණ්ඩලයේ ස්ථිර තනතුරක මව/පියා/ භාරකරු නියුක්ත ව සිටීම ය.

(ආ) මෙම චක්‍රලේඛයේ අංක 07 දරණ උපලේඛනයේ දැක්වෙන ලකුණු ක්‍රමය අනුව තෝරා ගැනීම් සිදු කළ යුතු ය. මෙම ලකුණු ක්‍රමය ද සම්මුඛ පරීක්ෂණ ආරම්භ කිරීමට සතියකට පෙර පාසල් දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනය කළ යුතු ය.

**5.7 විදේශගත ව සිට පැමිණි තැනැත්තන්ගේ දරුවන් - 02%**

මෙම ගණය සඳහා ළමයින් තෝරා ගැනීමේ පදනම පහත දැක්වේ.

(අ) මව/පියා/භාරකරු ළමයින් ඇතුළත් කිරීම සඳහා ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට ආසන්න වසරක් හෝ වැඩි කාලයක් විදේශගත ව සිටීම,

(ආ) මව/පියා/භාරකරු හා අදාළ දරුවා ද එම කාලය තුළ විදේශගත ව සිටීම

(ඇ) මෙහි දී තෝරා ගැනීම් මෙම චක්‍රලේඛයේ අංක 08 උපලේඛනයේ දක්වන ලකුණු ක්‍රමය අනුව විය යුතුය. මෙම ලකුණු ක්‍රමය සම්මුඛ පරීක්ෂණ ආරම්භ කිරීමට සතියකට පෙර පාසල් දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනය කළ යුතු ය.

**6.0 රජයේ සේවා අවශ්‍යතාව මත ස්ථාන මාරුවීම් ලැබ පැමිණෙන නිලධරයන්ගේ දරුවන්ට ලබාදෙන විශේෂ අනුග්‍රහය**

(අ) අදාළ වර්ෂයේ පළමු ශ්‍රේණිය සඳහා ළමයින් ඇතුළත් කරගැනීමෙන් පසු යම් රජයේ නිලධරයකුගේ/ සංස්ථා නිලධරයකුගේ/ රාජ්‍ය බැංකු නිලධරයකුගේ ඉල්ලීම මත නොව රජයේ අවශ්‍යතා මත පාසල පිහිටි ප්‍රදේශයට ස්ථාන මාරු ලැබ පැමිණෙන නිලධරයන්ට විශේෂ අනුග්‍රහයන් ලබාදීම පිණිස පන්තියකට එක් පුරප්පාඩුවක් ඉතිරි ව තබා ගැනීමට තීරණය කර ඇත.

(ආ) මේ යටතේ සලකා බලන්නේ යම්කිසි ප්‍රදේශයක 1 වන ශ්‍රේණියට ඇතුළත් වූ ළමයකුගේ මව/ පියා/ නිත්‍යානුකූල භාරකරු ඉහත (අ) ප්‍රකාර ස්ථාන මාරුවක් ලබා පාසල පිහිටි ප්‍රදේශයකට පදිංචිය වෙනස් කරන්නේ නම් පමණි.

(ඇ) මෙහි දි ස්ථාන මාරුව එක් දිස්ත්‍රික්කයකින් තවත් දිස්ත්‍රික්කයකට ලබා තිබීම සහ එම සේවා ස්ථාන අතර දුර ප්‍රමාණය කි.මී. 50 කට වැඩිවී තිබිය යුතුය.

(ඈ) තෝරා ගැනිමේ දී පහත සඳහන් කරුණු සැලකිල්ලට ගත යුතු ය.

i. නව සේවා ස්ථානයෙහි සේවා අවශ්‍යතාවයේ බලපෑම
ii. කලින් සිටි සේවා ස්ථානය හා ස්ථාන මාරුව ලබා පැමිණි සේවා ස්ථානය අතර දුර ප්‍රමාණය
iii. මව්පියන් මාරුවීම් ලැබ පැමිණ පදිංචි වූ ස්ථානයේ සිට ළමයා ඇතුළත් කිරීම සඳහා ඉල්ලුම් කරනු ලැබූ පාසලට ඇති ආසන්නතාව
iv. මව්පිය දෙදෙනාම මාරුවීම් ලැබ සිටි නම් වැඩි ප්‍රමුඛතාවයක් දීම.

(ඉ) මේ යටතේ සිසුන් ඇතුළත් කිරීම සඳහා විදුහල්පතිගේ නිර්දේශය සහිතව ජාතික පාසලක් නම් ජාතික පාසල් අධ්‍යාපන අධ්‍යක්ෂටත් පළාත් පාසලක් නම් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂටත් අයදුම්පත් (ලිපිලේඛන සහිත ව) ඉදිරිපත් කොට දෙමව්පියන් විසින් අනුමැතිය ලබාගත යුතු ය.

(ඊ) මෙම පුරප්පාඩුව අදාළ වනුයේ ඉහත නිර්ණායකවලට අනුකූල වන අයට පමණක් වන අතර එම පුරප්පාඩුව මෙයට අදාළ නොවන අයගෙන් පිරවීම කිසිසෙත් ම නොකළ යුතු ය.

(උ) ඉහත පුරප්පාඩුව 1 වන ශ්‍රේණියේ දී පිරවීමට සුදුස්සන් නොසිටියේ නම් ඉදිරි වර්ෂයක දී පිරවීම සඳහා එම පුරප්පාඩුව තබා ගත යුතු ය.

**7.0** ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටින ත්‍රිවිධ හමුදාවේ හා පොලීසියේ සාමාජිකයන්ගේ දරුවන්ට දී ඇති විශේෂ අනුග්‍රහය

(අ) අධ්‍යාපන අමාත්‍යාංශයත් ආරක්ෂක අමාත්‍යාංශයත් අතර ඇති කරගත් එකඟතාවක් මත දෙනු ලබන මෙම අනුග්‍රහය ක්‍රියාත්මක වන්නේ රේඛිය අමාත්‍යාංශයේ ජාතික පාසල් අංශය මඟිනි.

(ආ) ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටින ත්‍රිවිධ හමුදාවේ හා පොලිසියේ සාමාජිකයන්ට පළමු වන ශ්‍රේණියට ළමයින් ඇතුළත් කිරීමට දී ඇති විශේෂ අනුග්‍රහය, ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිට මියගිය/ අතුරුදහන් වූ හා ආබාධිත වූ සහ දැනට ක්‍රියාන්විත රාජකාරියේ සක්‍රියව යෙදි සිටින සාමාජිකයින්ට දීමට තීරණය කර ඇත. ක්‍රියාන්විත රාජකාරියේ යෙදිම සහ ක්‍රියාන්විතයට අයත් ප්‍රදේශ රාජ්‍ය ආරක්ෂක අමාත්‍යංශය, ත්‍රිවිධ හමුදාව සහ පොලිසියේ එකඟත්වය මත නම්කරනු ලැබේ. තෝරා ගැනිමේ දී පහත සඳහන් පරිදි ප්‍රමුඛතාව ලබා දිය යුතු ය.

**i.** ක්‍රියාන්විත රාජකාරියේ යෙදි සිටිය දී මියගිය අයගේ/ අතුරුදහන් වුවන්ගේ දරුවන්
**ii.** රාජකාරියේ යෙදි සිටිය දි පත් වූ ආබාධිත තත්ත්වයේ ස්වභාවය අනුව
**iii.** ක්‍රියාන්විත රාජකාරියේ දැනට සක්‍රියව යෙදි සිටින අය

(ඇ) ආරක්ෂක අමාත්‍යාංශය විසින් අදාළ බලධාරින්ගේ අත්සනින් යුතු ව මෙම අමාත්‍යාංශයට ඉදිරිපත් කරනු ලබන උක්ත සමාජිකයින්ගේ අයදුම්පත් නියමිත සුදුසුකම් සපුරා ඇත්දැයි පරීක්ෂා කර බලා පාසලකට සාධාරණ ශිෂ්‍ය සංඛ්‍යාවක් බෙදී යන සේ සකස් කරගනු ලැබේ.

(ඈ) එම ළමයින් ගේ නම් ඒ සඳහා පිළියෙල කරන ලද විශේෂ ආකෘතියක් මඟින් පාසලට එවනු ඇත. එම ළමයින් සම්මුඛ පරීක්ෂණයට භාජනයකර අනන්‍යතාව හා (ආ) ජේදයෙහි දක්වා ඇති ප්‍රමුඛතා කාණ්ඩවලට අයිති බව නිශ්චිත ව තහවුරු කරගෙන ඇතුළත් කරගත යුතු ය.

(ඉ) මෙම විශේෂ අනුග්‍රහයට හිමිකම් නොලබන ත්‍රිවිධ හමුදා සහ පොලිසියේ සාමාජිකයින්ගේ දරුවන්ගේ අයදුම්පත් අදාළ බලධාරින් ඉදිරිපත් කර ඇත්නම් තේරීම් ලැයිස්තුවට ඇතුළත් කිරීමට පෙර හෝ පසුව තේරීම් ලැයිස්තුව පාසලේදී සම්මුඛ පරීක්ෂණයට භාජනය කිරීමේ දී හෝ ඉවත් කරනු ලැබිය හැකිය.

(ඊ) නියමිත දිනයෙන් පසු ව ලැබෙන ඉල්ලීම් පිළිබඳ ව කිසිසේත් සලකා නොබලනු ඇත. නියමිත දිනයෙන් පසුව එවන ඉල්ලීම් ගැන සලකා බැලීමට නොහැකි වන්නේ ඒ වනවිට පන්තිවලට ඇතුළත් කළ යුතු ශිෂ්‍ය සංඛ්‍යාව තෝරා ගෙන අවසන් වන නිසා ය.

(උ) මේ පිළිබඳ ව සියලු විධිවිධාන රේඛීය අමාත්‍යාංශයෙන් පමණක් පාසල්වලට දන්වනු ලබන අතර වෙනත් බලධාරියකුට එවැන්නක් ඉදිරිපත් කිරීමට කිසිදු බලයක් නැති බව සැලකිය යුතු ය.

(ඌ) යම්කිසි පාසලකට වෙන්කර ඇති ශිෂ්‍ය සංඛ්‍යාව අනුව මෙම අමාත්‍යාංශයෙන් එවන ලද ළමයින් ඇතුළත් කිරීමෙන් පසු තවදුරටත් පුරප්පාඩු පවතී නම්, එම පුරප්පාඩු මෙම අමාත්‍යාංශයෙන් උපදෙස් ලැබෙන තුරු අනිකුත් ගණයන්ගෙන් පිරවීම නොකළ යුතු යි.

(එ) මෙම අනුග්‍රහය තාවකාලික එකක් වන අතර, මෙම අමාත්‍යාංශයේ ලේකම් විසින් දන්වා සිටි අවස්ථාවක එය අත්හිටුවිය හැකි ය.

(ඒ) මේ යටතේ ඇතුළත් කරගැනීමේ දී විදුහල්පතිවරුන් තේරීම් ලේඛනය සමඟ එවන ආවරණ ලිපියේ උපදෙස් පරිදි ක්‍රියා කළ කලයුතු අතර යම් ගැටළුවක් වේනම් අධ්‍යාපන අමාත්‍යාංශයේ ජාතික පාසල් අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් උපදෙස් ලබා ගැනිමට වග බලා ගත යුතු යි.

(ඔ) සමහර පාසල්වලට වැඩි ඉල්ලුමක් ඇති බැවින් මෙම පළමු කැමැත්ත ලෙස අයදුම් කරන පාසල එසේ අයදුමකරන සියලුදෙනාට ම ලබා දිය නොහැක. සුදුසුකම් ප්‍රමුඛතාව අනුව පාසල් ලබාදෙනු ඇත.

(ඕ) මෙම විශේෂ අනුග්‍රහය ලබන අයට 5.1 සිට 5.7 දක්වා ඡේද යටතේ සාමාන්‍ය පිළිවෙළ අනුව ද අයදුම් කළ හැකි ය. එසේ ඉල්ලුම් කිරීම අයදුම්කරුවන්ගේ වගකීමකි.

**8.0** අයදුම්පත් ලැබීමෙන් පසු ක්‍රියා පිළිවෙළ

**8.1** අයදුම්පත් එවිය යුතු අවසාන දිනයෙන් පසු ව, සියලු ම අයදුම්පත් විදුහල්පතිවරයාගේ පෞද්ගලික අධීක්ෂණය යටතේ පැහැදිලි ලෙස ඉහත 5.1 සිට 5.7 දක්වා ගණ අනුව වර්ගීකරණය කළ යුතු ය.

**8.2** එසේ වර්ගීකරණය කරන ලද අයදුම්පත් අංක කර සී.ආර්. පොතක ඒ ඒ ගණයට වෙන් කරන ලද පිටුවල, අනු අංක සහිත ව ලේඛන ගත කළ යුතු ය. මේ සඳහා පොතෙහි එක යාව පිහිටි පිටු දෙකක් සම්බන්ධ වන සේ යෙදිය හැකි වන අතර, පහත සඳහන් ආකෘතිය ඒ සඳහා භාවිත කළ යුතු ය.

ගණය : ..........................................................................................

| අනු. අංකය | ළමයාගේ නම | උපන් දිනය | ස්ත්‍රී/ පුරුෂ භාවය | මව/පියා/ භාරකරුගේ නම | ලිපිනය | පාසලට ඇති දුර | ලබාගත් ලකුණු | විශේෂ සටහන් |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | |

**8.3** ක්‍රියාන්විත සේවයේ නිලධරයන්ගේ දරුවන් 5.1 සිට 5.7 දක්වා ඡේද යටතේ සාමාන්‍ය පිළිවෙළ අනුව පාසල්වලට ඉල්ලුම් කරන අවස්ථාවේ දි ඔවුන්ට අදාළ සුදුසුකම් තිබේ නම් ක්‍රියාන්විතය සඳහා ලබා දෙන විශේෂ වරප්‍රසාද ගැන නොසලකා කටයුතු කළ යුතු ය.

**8.4** සියලු ම ගණ සඳහා ලකුණු ලබාදීමේ ක්‍රමයක් හඳුන්වා දී ඇති නිසා එක් එක් ගණය සඳහා වෙන වෙන ම, ඉදිරිපත් කරන ලේඛණයන් හි අඩංගු අවශ්‍ය විස්තර සටහන් කර ගැනිමටත් ලකුණු ක්‍රමයට අනුව ලකුණු ලබා දීමටත් පාසල විසින් ලකුණු ලබාදිමේ පත්‍රිකා සාදාගත යුතු ය.

**8.5** පළමුවන ශ්‍රේණියට ළමයින් ඇතුළත් කිරීම සඳහා සම්මුඛ පරීක්ෂණය පහත අනුපිළිවෙළට පැවැත්වීමට සියලු ම විදුහල්පතිවරුන් වග බලා ගත යුතු ය.

- **i.** ආදි ශිෂ්‍ය පදනම මත
- **ii.** සහෝදර පදනම මත
- **iii.** ස්ථාන මාරුවීමේ පදනම මත
- **iv.** පාසල් අධ්‍යයනයට සෘජුවම බලපාන ආයතනවල කාර්යමණ්ඩල පදනම මත.
- **v.** විදේශගත ව සිට පැමිණීමේ පදනම මත
- **vi.** ගෘහ මූලික නොවන පදනම මත
- **vii.** ගෘහ මූලික පදනම මත

9.0 තෝරා ගැනීමේ සම්මුඛ පරීක්ෂණය :

**9.1** ප්‍රථම සම්මුඛ පරීක්ෂණය :-

(අ) අයදුම්පත් ලැබී ලේඛනගත කිරීමෙන් පසු ව ස්ථාපිත කරන ලද සම්මුඛ පරීක්ෂණ මණ්ඩල විසින් අදාළ මව්පියන් /භාරකරුවන් සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවිය යුතු ය. කැඳවීම් ලිපි පාසලේ ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව සහිත ව සති දෙකකටවත් කලින් අදාළ මව/පියා/නීත්‍යනුකූල භාරකරුට ලැබෙන සේ තැපෑලෙන් යැවිය යුතු ය. එසේ ම සම්මුඛ පරීක්ෂණ පැවැත්වෙන දින පිළිබඳ විස්තර කල් ඇති ව, පාසලේ උදෑසන රැස්වීමේ දී ප්‍රකාශ කිරීමෙන් හා දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනය කිරීමෙන් ප්‍රසිද්ධ කළ යුතු ය.

(ආ) ඉහත 8.4 අනුව සාදාගත් ලකුණු ලබාදිමේ පත්‍රිකා සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කිරීම පිණිස සම්පූර්ණ කර රැගෙන ඒම සඳහා කැඳවීම් ලිපිය සමඟ දෙමාපියන් වෙත යැවිය යුතුය.

(ඇ) ගෘහ මූලික හා ගෘහ මූලික නොවන ගණයන් සඳහා පාසල විසින් තීරණය කළ දුර සීමාව හා එම දුර සීමාව සඳහා චක්‍රලේඛයට අනුව සාදාගත් ලකුණු පරාසයන් ද එම ගණ දෙමව්පියන් වෙත දැනුම් දිය යුතුය.

(ඈ) අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවීමේ ලිපියෙහි තාවකාලික ලකුණු ප්‍රමුඛතා නාම ලේඛනය පාසලේ ප්‍රසිද්ධ කරන දින වකවානු සඳහන් කළ යුතු ය.

**9.2** (අ) ළමයින් තෝරා ගැනීම සඳහා තම හිමිකම් සනාථ කිරීමට මව්පිය/නිත්‍යානුකූල භාරකරුවන් විසින් ස්ථිර වාසස්ථානයේ හිමිකම සනාථ කිරීමට අදාළ ලේඛණයේ ඉල්ලුම්පතට ඇමුණු ඡායාපිටපතේ මුල් පිටපතක් ද, උප්පැන්න සහතිකයේ මුල්පිටපතක් ද සමග ඒ ඒ ගණයන් වෙනුවෙන් ලබා දී ඇති ලකුණු ක්‍රමයට අනුකූලව ලකුණු ලබාගැනිම සනාථ කිරිම සඳහා අදාළ වන සියලු ලිපිලේඛනයන් හි මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු යි.

(ආ) දෙමව්පියන් විසින් සම්පූරණ කර රැගෙන එනු ලබන ලකුණු ලබාදීමේ පත්‍රිකා මේ ලකුණු සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ඉහත ලිපිලේඛන පරීක්ෂා කිරීමෙන් අනතුරුව සනාථ කරගත යුතුය.

**9.3** (අ) තමා විසින් ඉදිරිපත් කරනු ලබන ලිපි ලේඛනවල නිරවද්‍යතාව, දිවුරුම් පෙත්සමක් මඟින් සහතික කළ යුතු ය.

(ආ) එසේ වුව ද, ඉදිරිපත් කරන ලද යම් ලේඛනයක් කූට ලේඛනයක් යැයි සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට හැඟී යන්නේ නම්, එය නිකුත් කර ඇති ආයතනයෙන් හෝ බලධාරියාගෙන් විමසීමක් කොට එහි සත්‍ය අසත්‍යතාව තහවුරු කර ගැනීමට සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සභාපතිට බලය ඇත. එවැනි අවස්ථා ඇති වු කල්හි ඒ පිළිබඳ ව අදාළ බලධාරියාට සුදුසු පරිදි කටයුතු කිරීමට දන්වා සිටිය හැකි ය. ඒ අනුව ඉදිරිපත් කර ඇති ලේඛනයක්/ලේඛන, කූට ලේඛනයක්/ලේඛන යයි සනාථ වන්නේ නම් එවැනි ලේඛනයක්/ලේඛන ඉදිරිපත් කිරීමට විරුද්ධ ව නිත්‍යානුකූල ව කටයුතු කිරීමට පියවර ගත යුතුය. තවද ඉදිරිපත් කරනු ලබන ලේඛණවලින් එක් ලේඛනයක් හෝ කූට ලේඛනයක් නම් එම හේතුව නිසා ම අයදුම්පත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ප්‍රතික්ෂේප කළ හැකි ය.

(ඇ) අවශ්‍ය අවස්ථාවල දී පදිංචි ස්ථානය සනාථ කිරීම සඳහා නිලධාරියකු, විදුහල්පති හෝ ඔහුගේ නියෝජිතයකු අයදුම්කරුගේ පදිංචි ස්ථානයට ගොස් පරීක්ෂා කිරීම කළ හැකි ය. මේ සඳහා වෙනත් රාජ්‍ය ආයතන හා නිලධාරින්ගේ සේවය අවශ්‍ය වන්නේ නම් විදුහල්පතිවරයා හට අදාළ බලධාරින්ගෙන් සහාය ඉල්ලා සිටිය හැකි ය.

(ඈ) මෙසේ ඉදිරිපත් කරනු ලබන ලේඛනවල ඡායාස්ත පිටපත් අයදුම්කරු විසින් නිවැරදි බවට සහතික කර ගෙන ඒ ඒ ළමයාට වෙන් කරනු ලබන ගොනුවක ගොනු කොට තබා ගත යුතු ය. තවද ලකුණු සනාථ කරගත් ලකුණු ලබාදීමේ පත්‍රිකාව ද මෙම ගොනුවේ ගොනුකර තබාගත යුතුය.

**9.4** ඉදිරිපත් කර ඇති ලිපි ලේඛනවල වලංගුතාව නිසැක ව ම දැන, මව්පියන්/ නිත්‍යානුකූල භාරකරුවන් විසින් කරන ලද හිමිකම් පෑම සත්‍ය බව ඔප්පු කිරීමෙන් පසු ඉහත 4.1 ඡේදයේ සඳහන් සම්මුඛ පරීක්ෂණ මණ්ඩල මඟින්, ලේඛණ පිළියෙල කළ යුතු යි. මෙහි දී

(අ) පාසලට ඇතුළත් කිරීම සඳහා ළමයින්ගේ තාවකාලික ලකුණු ප්‍රමුඛතා ලැයිස්තුවක් ලකුණු ප්‍රමුඛතා අනුව පිළියෙල කල යුතු ය. තවද එක් එක් ගණ සඳහා වෙන වෙන ම තාවකාලික ලකුණු ප්‍රමුඛතා ලැයිස්තුවක් සැකසිය යුතුය. (සම්මුඛ පරීක්ෂණයට පෙන සිටි සියලු ම අයගේ නම් එයට ඇතුළත් විය යුතු යි)

(ආ) තාවකාලික ලකුණු ප්‍රමුඛතා ලැයිස්තුව පහත දක්වා ඇති ආකෘතියට අනුකූල විය යුතු ය.

ගණය/වර්ගය : පුරප්පාඩු සංඛ්‍යාව :

(ඇතුළත් කිරීමට නියමිත)

| අනුක්‍රමික අංකය | ළමයාගේ නම | මවගේ/ පියාගේ හෝ නිත්‍යානුකූල භාරකරුගේ නම | ලිපිනය | ලබාගත් ලකුණු | විශේෂ සටහන් |
|---|---|---|---|---|---|
| | | | | | |

සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය :

නම අත්සන

1.
2.
3.
4.
5.

(ඇ) යම් ශ්‍රේණියකට අදාළ ශිෂ්‍ය සංඛ්‍යාව නොමැති විට අවශ්‍ය ශිෂ්‍ය සංඛ්‍යාව අනෙකුත් ශ්‍රේණි අතර ප්‍රතිශතය අනුව අනුපාතික ව බෙදී යාමට වගබලා ගත යුතු වේ.

(ඉ) ඉහත සඳහන් පරිදි සකස් කරන ලද තාවකාලික ලකුණු ප්‍රමුඛතා ලැයිස්තුව පිටපත් 04ක් සකස් කර සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සියලුම සාමාජිකයන් සියලු ම පිටුවල අත්සන් කිරීමෙන් අනතුරු ව, ජාතික පාසලක් නම් ජාතික පාසල් අධ්‍යාපන අධ්‍යක්ෂට එක් පිටපතක් ද පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂට එක් පිටපතක් ද පළාත් පාසලක් නම් අදාළ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂට හා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂට එක් පිටපතක් බැගින් ද ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර තෙවන පිටපත පාසල් දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනය කළ යුතු ය. සිව්වන පිටපත පාසල් ගොනුවේ ගොනු කිරීම ද කළ යුතු ය.

(ඊ) දැන්වීම් පුවරුවේ යොදන තාවකාලික ලැයිස්තුව සති දෙකක්වත් අඛණ්ඩ ව ප්‍රදර්ශනය කළ යුතු ය. තාවකාලික ලකුණු ප්‍රමුඛතා ලැයිස්තුව අදාළ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ අත්සන නොමැති ව ප්‍රසිද්ධ කිරීම නොකළ යුතු ය.

## 10.0 අභියාචනා හා විරෝධතා ඉදිරිපත් කිරීම

10.1 (අ) ප්‍රදර්ශනය කරන ලද තාවකාලික ලකුණු ප්‍රමුඛතා ලැයිස්තුව පාසල් දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනය කර සති 2ක් ඉකුත්වීමට පෙර ලේඛනයේ යම් ස්ථානයක නුසුදුසු ළමයකුගේ නම අඩංගු වී ඇත්නම් ඒ පිළිබඳ විරෝධතාව හා/හෝ සුදුසුකම් තිබියදීත් තම දරුවාගේ නම නුසුදුසු තැනක ඇත්නම් ඒ පිළිබඳව අභියාචනාවක් විදුහල්පති වෙත ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුය. ඒ සමග ලිපිනය සඳහන් ලියාපදිංචි තැපැල සඳහා අවශ්‍ය මුද්දර සහිත ලියුම් කවරයක් ද එවිය යුතු ය. මෙම කාලසීමාවෙන් පසු ව ඉදිරිපත් කරනු ලබන කිසිදු අභියාචනාවක් හෝ විරෝධතාවයක් සලකා බලනු නොලැබේ. විරෝධතාව මෙහි උපලේඛන අංක 09 හි සඳහන් පරිදි පිළියෙල කළ යුතු ය.

(ආ) විරෝධතා ඉදිරිපත් කිරීමේදී නම් වශයෙන් නිශ්චිතව විරෝධතා ඉදිරිපත් කළ යුතුය. සමූහයක් වශයෙන් හෝ මුළු ලේඛනයට ම විරෝධතා නොකළ යුතු ය.

10.2 (අ) විදුහල්පතිගේ පෞද්ගලික අධීක්ෂණය යටතේ සියලු ම විරෝධතා ලිපි වෙන වෙන ම අංක කර, පහත ආකෘතියට අනුව ලේඛනගත කළ යුතුවේ. නිර්නාමිකව විරෝධතා දක්වන ලිපි ද මෙම උපලේඛණයට ඇතුළත් කළ යුතු වේ.

| අනු අංකය | විරෝධතාවට ලක්වූ දරුවාගේ නම | එම දරුවා තෝරුනු ශ්‍රේණය හා කැඳවීම් අංකය | එම දරුවාගේ මව/පියා/ භාරකරුගේ නම හා ලිපිනය | ලිපි අංකය | දැක්වූ විරෝධතාව කෙටියෙන් |
|---|---|---|---|---|---|
| | | | | | |

මෙම ලේඛනය රහසිගත ව තබා ගත යුතු වේ.

(ආ) මීට අමතර ව අභියාචනා ඉදිරිපත් කළ අයගේ ලේඛනයක් ද සකස් කර ගත යුතු ය.

10.3 (අ) සියලු ම විරෝධතා හා අභියාචනා ලේඛන ගතකර, දෙසතියක කාල සීමාව ඉකුත් වීමෙන් පසු දින දහයක් ඇතුළත විරෝධතාවලට ලක්වූ ළමයින්ගේ සංඛ්‍යාව හා අභියාචනා කර ඇති සංඛ්‍යාව ජාතික පාසලක් නම් ජාතික පාසල් අධ්‍යාපන අධ්‍යක්ෂට ද පළාත් පාසලක් නම් අදාළ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂට හා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත දැනුම් දිය යුතු ය.

(ආ) ලේඛණගත ඉහත සඳහන් ලේඛනයන් 2 අනුසාරයෙන් , මූලික සම්මුඛ පරීක්ෂණයට උපයෝගී කරගත් (සී.ආර්.පොත) අදාළ නම් යටින් එක් පාටකින් ඉරි ඇඳීම හෝ ඉස්මතු කිරීමෙන් ( ධඝතගම්ඝතගබ ) විරෝධතාවට ලක් වන බව දැක්විය යුතු අතර අභියාචනා ඉදිරිපත් කළ අයගේ නම් වෙනත් පාටකින් ඉරි ඇඳීම හෝ ඉස්මතු කිරීම කළ යුතු ය.

## 10.4 අභියාචනා හා විරෝධතා පරීක්ෂණය

(අ) පාසල වෙත ලැබූ අභියාචනා හා විරෝධතා විධිමත් ව පරීක්ෂා කොට තීරණයක් ගැනීම සඳහා අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලයක් පත් කර ගත යුතු ය.

(ආ) අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයන් පහත සඳහන් පරිදි විය යුතු යි.

i. අධ්‍යාපන අමාත්‍යාංශයේ / පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ/ කලාප අධ්‍යාපන කාර්යාලයේ නියෝජිතයෙක්
ii. අභියාචනා හා විරෝධතා පරීක්ෂා කරනු ලබන විදුහලේ ප්‍රථම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයෙක් නොවන නියෝජ්‍ය විදුහල්පතිවරයෙක් / ජ්‍යෙෂ්ඨ ගුරුවරයෙක්
iii. ප්‍රාථමික පංති සහිත ආසන්න පාසලක විදුහල්පතිවරයෙක්

(ඇ) ජාතික පාසල් වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් ද පළාත් පාසල් වෙනුවෙන් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ද ඉහත අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලය පත් කරනු ලැබේ.

(ඈ) මෙම අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලයේ සභාපති වනුයේ ඉහත (ආ) 1 හි සඳහන් නියෝජිතයා ය.

(ඉ) විරෝධතා විභාග කිරීමේ දී විරෝධතාවන්ට ලක් වූ ළමයාගේ දෙමව්පියන් විසින් ඉදිරිපත් කර ඇති ලිපිලේඛන (ප්‍රථම සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කළ) නැවත වරක් විමර්ශනය කරන අතර විරෝධතාව දැක්වූ අය කැඳවා විරෝධතාවෙහි නිරවද්‍යතාව විමර්ශනයට ලක් කළ යුතු යි. ඉන්පසු විරෝධතාවට ලක් වූ ළමයාගේ දෙමව්පියන් ද කැඳවා පරීක්ෂා කර තීරණයකට එළඹීම අවශ්‍ය වේ. විරෝධතාව දැක්වූ දෙමාපියන් හා විරෝධතාවයට ලක්වූ දරුවන්ගේ දෙමාපියන් වෙන වෙනම කැඳවිය යුතුය. ප්‍රථම සම්මුඛ පරීක්ෂණයේ දී භාවිත කළ සී.ආර්. පොතෙහි විශේෂ සටහන් තීරුවේ මේ පිළිබඳ විස්තර හා තීරණ රතු පාටින් ලියා දැක්විය යුතු අතර විරෝධතා පරීක්ෂණය සම්බන්ධ ව වෙන ම වාර්තාවක් ද තබා ගත යුතු යි.

(ඊ) අභියාචනා විභාග කිරීමේ දී අභියාචනා ඉදිරිපත් කළ සියලු ම දෙනා කැඳවා ප්‍රථම සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කළ ලිපිලේඛන පමණක් නැවත වරක් විමර්ශනය කළ යුතු ය. මෙහිදී ගනු ලබන තීරණ හා අදාළ විස්තර ප්‍රථම සම්මුඛ පරීක්ෂණයේදී උපයෝගී කරගත් සී.ආර්. පොතෙහි රතු පාටින් විශේෂ සටහන් තැබිය යුතු ය.

(උ) අභියාචනා හා විරෝධතා විමර්ශනයෙන් පසු ගනු ලැබූ තීරණය අභියාචනා/විරෝධතා ලිපියේ (උපලේඛණ 09 අනුව සැකසූ) ද සටහන් කර තැබිය යුතු ය.

(ඌ) අභියාචනා හා විරෝධතා විභාග කිරීමේ දි රැස්වීම් කටයුතු විවෘතව හා විනිවිදභාවයෙන් යුක්තව පැවැත්විය යුතු යි.

(එ) කුමන තත්ත්වයක් යටතේ වුව ද අභියාචනා හා විරෝධතා පරීක්ෂණයට කැඳවීම හා සංවිධාන කටයුතු පාසල් ප්‍රධානියා විසින් කළ යුතු වන්නේ ය.

## 11.0 අවසාන ලැයිස්තුව

11.1 අභියාචනා හා විරෝධතා මණ්ඩලය විසින් අභියාචනා හා විරෝධතා පරීක්ෂා කිරීමෙන් පසු අවසාන ලැයිස්තුව සැකසිය යුතු ය. මෙහි දී සුදුසුකම් අනුව තාවකාලික ලකුණු ප්‍රමුඛතා ලැයිස්තුවේ නියමිත ස්ථානයට අභියාචනාකරුවන් හා විරෝධතාවයට ලක්වූ/ දැක්වූ සියලු ම දෙනා ඇතුළත් කොට නැවත ලේඛණය සකස් කළ යුතු ය.

11.2 (අ) සංශෝධිත තාවකාලික ලකුණු ප්‍රමුඛතා ලැයිස්තුව අනුව අවසාන ලැයිස්තුව සැකසීමේ දී ගණ දෙකක ට වඩා වැඩි ගණ සංඛ්‍යාවකට අයත් වන තැනැත්තන්ට ප්‍රමුඛතාව ලබා දීම සඳහා

i. සෑම ගණයකට ම තෝරා ගත යුතු දරුවන් සංඛ්‍යාවට අමතර ව එම සංඛ්‍යාවෙන් 25%ක් හෝ දරුවන් 20ක් යන දෙකෙන් අඩු සංඛ්‍යාව ඇතුළත් වන පරිදි ලැයිස්තු සලකුණු කළ යුතු ය.

ii. ඉහත (i)හි සඳහන් ආකාරයට අමතර ව සලකුණු කල ළමයින් සංඛ්‍යාව තුළ යම් අයකුගේ නම ලැයිස්තු 03ක හෝ ඊට වැඩි සංඛ්‍යාවක ඇතුළත් වේ නම් ඒ ළමයා වැඩිම ප්‍රතිශතය හිමි වන ගණය යටතේ අවසාන ලැයිස්තුවේ අවසානයට ඇතුළත් කළ යුතු යි. මෙය පන්තියක 34 සීමාව නොඉක්මවිය යුතු ය.

(ආ) ඉහත (අ) ඡේදය ද අදාළ කරගෙන ඒ ඒ ගණයන්ට අදාළ සංශෝධිත තාවකාලික ලකුණු ප්‍රමුඛතා ලැයිස්තුවෙන් ඒ ඒ ගණයට අදාළ පුරප්පාඩු සංඛ්‍යාවට අනුව ඉහළ ම සිටින අය තෝරාගෙන අවසාන නාම ලේඛණය සැකසිය යුතු ය.

11.3 (අ) සමාන්තර පන්තියකට ළමයින් 34 දෙනෙකු ඇතුළත් වන සේ එක් එක් ගණයන්ට වෙන වෙන ම අවසාන ලැයිස්තුව පිටපත් 04කින් සකස් කර අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලයේ සියලු ම සමාජිකයන් විසින් අදාළ ලේඛනයන් හි සියලු පිටුවල අත්සන් යෙදීමෙන් පසු එම අවසාන ලේඛනය විදුහල්පති විසින් භාර ගෙන එක් පිටපතක් අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලයේ සභාපති වෙත භාරදිය යුතුය. පළාත් පාසලක් නම් අදාළ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත එක් පිටපතක් ද, ජාතික පාසලක් නම් ජාතික පාසල් අධ්‍යක්ෂ වෙත එක් පිටපතක් ද ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර එහි තෙවන පිටපත පාසල් දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශන කළ යුතු වේ. සිව්වන පිටපත පාසල් ලිපිගොනුවේ ගොනු කළ යුතු වේ.

(ආ) අවසාන ලැයිස්තු සකසන අවස්ථාවේදී ම ඒ ඒ ගණයන්ට අදාළ නොතේරුණු ළමයින්ගේ නාමලේඛණය ද ලකුණු අනුපිළිවෙළට පිටපත් 03කින් සකස් කර අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලයේ සියලු ම සාමාජිකයින් විසින් අදාළ ලේඛනයේ සියලු ම පිටුවල අත්සන් යෙදීමෙන් පසුව විදුහල්පති විසින් භාරගෙන එක් පිටපතක් අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලයේ සභාපති වෙත ද, දෙවන පිටපත දැන්වීම් පුවරුවේ ද තෙවන පිටපත පාසල් ලිපිගොනුවේ ද ගොනු කළ යුතු ය. සභාපතිට භාරදෙන පිටපත පසුව සභාපතිගේ පත්වීම් බලධාරියාට ලබාදිය යුතු ය.

(ඇ) දැන්වීම් පුවරුවේ යොදන ලේඛන දෙක (අවසාන ලැයිස්තුව හා නොතේරුනු ළමයින්ගේ ලේඛනය) අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලයේ ද අත්සන් නොමැති ව ප්‍රසිද්ධ කිරීම නොකළ යුතුය. තවද මෙම ලේඛන සති 02ක් වත් අඛණ්ඩ ව ප්‍රදර්ශනය කළ යුතු ය.

11.4 තෝරාගත් අයට ලිඛිත ව විදුහල්පතිගේ අත්සන හා නිල මුද්‍රාව සහිත ව (උපලේඛන අංක 10 ආකෘතිය අනුව) දැනුම් දිය යුතු අතර, තෝරා නොගත් අයට ළමයා අයත් ගණය ද තෝරා නොගැනීමට හේතු ද පැහැදිලි ව සඳහන් කොට ලිඛිත ව දන්වා යැවිය යුතු ය. ළමයින් තෝරා ගැනීමේ දී ඒ ඒ ගණයට සීමා වූ අවම ලකුණු වෙන් වෙන් වශයෙන් අනිවාර්යයෙන් ම මෙම ලිපියේ සඳහන් කළ යුතු ය. මේ සඳහා මෙම චක්‍රලේඛයේ උපලේඛන අංක 11 දරණ ආකෘතිය භාවිත කළ යුතු ය.

11.5 තෝරාගත් ළමයින්ගේ ලියකියවිලිවල ඡායා පිටපත් අඩංගු ලිපිගොණුවක් එක් එක් ළමයා සම්බන්ධයෙන් පාසලේ තබාගත යුතු ය. නොතේරුණු ළමයින්ගේ ලිපිගොනු ද වෙන ම තබාගත යුතු ය.

11.6 අභියාචනා හා විරෝධතා ඉදිරිපත් කරන ලද යම් තෝරා ගැනීමක් පිළිබඳ අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලය විසින් දෙනු ලබන තීරණය අවසාන තීරණය වනු ඇත.

11.7 පංතියක් සඳහා අවසාන ලැස්තුවෙන් තෝරාගත් ළමයින් 34 දෙනාත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් තෝරා එවනු ලබන 7.0 ඡේදයේ සඳහන් ත්‍රිවිධ හමුදාවේ හා පොලිසියේ සාමාජිකයින්ගේ සුදුසුකම් ලබන ළමයින් 05 දෙනාත් ඇතුළත් කර ගත යුතු ය. මේ අනුව පළමුවන ශ්‍රේණියට සමාන්තර පන්තියකට අවසාන වශයෙන් තෝරා ගත හැකි උපරිම ශිෂ්‍ය සංඛ්‍යාව 39 කි.

11.8 පළමු වන ශ්‍රේණියට ළමයින් ඇතුළත් කිරීමෙන් පසුව රජයේ සේවා අවශ්‍යතාව මත ස්ථාන මාරුවීම් ලබ පැමිණෙන නිලධරයන්ට ලබාදෙන විශේෂ අනුග්‍රහය මත පංතියකට එක් ශිෂ්‍යයෙක් ඇතුළත් කරගැනීමෙන් අනතුරු ව පළමුවන ශ්‍රේණියේ සමාන්තර පංතියක අවසාන වශයෙන් සිටිය හැකි උපරිම ශිෂ්‍යය සංඛ්‍යාව 40 කි.

11.9 (අ) තෝරාගත් අවසන් ලැයිස්තුවේ නම් සඳහන් ළමයින් ඇතුළත් කිරීමෙන් පසුව ද පුරප්පාඩු ඇති වුවහොත්, එම පුරප්පාඩු ඇති වන ගණය අනුව නොතේරුණු ළමයින්ගේ ලේඛනයෙන් පිරවිය යුතු ය. එහි දී ද අදාළ ගණයේ ලකුණු ප්‍රමුඛතාව මත ම තෝරා ගත යුතු ය.

(ආ) ඉනික්බිති ව තවදුරටත් පුරප්පාඩු වෙතොත් පළාත් පාසලක් නම් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයාට ද ජාතික පාසලක් නම් ජාතික පාසල් අධ්‍යාපන අධ්‍යක්ෂවරයාටද පාසල් ප්‍රධානියා විසින් ඒ බව දැනුම්දී උපදෙස් ලබාගත යුතුය.

12.0 තෝරා නොගත් ළමයින්ට පාසල් ලබා දීම :

(අ) පාසලකට, තෝරා නොගත් යම් ළමයකුගේ මව්පිය/භාරකරු විසින් තමන්ගේ ළමයාට විකල්ප පාසලක් ලබා ගැනීම සඳහා තමන් පදිංචි ප්‍රදේශයේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා වෙත, නව ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කළ යුතු ය.

(ආ) තෝරා නොගත් ළමයින් පිළිබඳ වාර්තාවක් පාසල් ප්‍රධානියා විසින් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතු ය. අදාල කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ එකී ළමයින්ට විකල්ප පාසල් ලබාදීමට කටයුතු කළ යුතු යි.

13.0 (අ) පළමුවන ශ්‍රේණියට ළමයින් තෝරා ගැනීමේ වැඩ කටයුතු පහත සඳහන් කාල රාමුවට අනුව අනිවාර්යයෙන් ම නිම කළ යුතුයි.

| | |
|---|---|
| ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනය | - ජුනි 30 |
| සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම | - අගෝස්තු 25 ට පෙර |
| තාවකාලික ලැයිස්තුව දැන්වීම් පුවරුවේ දැමීම | - සැප්තැම්බර් 15 |
| අභියාචනා හා විරෝධතා භාරගැනීමේ අවසාන දිනය | - සැප්තැම්බර් 30 |
| අභියාචනා හා විරෝධතා පරීක්ෂණය | - ඔක්තෝබර් 15 - ඔක්තෝබර් 30 |
| අවසාන ලේඛනය ප්‍රසිද්ධ කිරීම | - නොවැම්බර් 15 |
| පළමුවන ශ්‍රේණියේ පංති ආරම්භ කිරීම | - පළමු පාසල් වාරය ඇරඹෙන දින |

(ආ) දෙසැම්බර් මස අග සති දෙක ඇතුළත තෝරා ගත් ළමයින් හඳුනා ගැනීම සඳහා කණ්ඩායම් වශයෙන් පාසල්වලට ගෙන්වා ගත යුතු අතර ජනවාරි පළමු වන සතියේ දී පළමු ශ්‍රේණියේ පන්ති විධිමත් ලෙස ආරම්භ කළ යුතු වේ.

## **III** කොටස

### 2 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණි දක්වා (6 වැනි ශ්‍රේණිය හැර) පන්තිවලට

### <u>සිසුන් ඇතුළත් කිරීම.</u>

14.0 2 වැනි ශ්‍රේණියේ සිට 11 වැනි ශ්‍රේණිය දක්වා (6 වැනි ශ්‍රේණිය හැර) පන්තිවල පුරප්පාඩු පිරවීමේ දී පහත දැක්වෙන සිසුන්ට ප්‍රමුඛතාව ලබා දිය යුතු ය.

(අ) පෞද්ගලික වාසස්ථානයෙන් බැහැර ව වාසය කිරීමට සිදුවන පාර්ලිමේන්තුවට තේරී ඇති නියෝජිතයන්ගේ දරුවන්

(ආ) ස්ථාන මාරුවක් ලැබ පාසල පිහිටි ප්‍රදේශයේ වාසයට පැමිණි රජයේ නිලධරයන්ගේ / සංස්ථා සේවකයන්ගේ / රාජ්‍ය බැංකු නිලධරයන්ගේ දරුවන්

(ඇ) විදේශයන් හි දෙවර්ෂයකට වැඩි කාලයක් මව, පියා හා දරුවා පදිංචිව සිට ආපසු පැමිණෙන ශ්‍රී ලංකිකයන්ගේ දරුවන්

(ඈ) පාසල පිහිටි ප්‍රදේශයට සැබැවින්ම තම ස්ථිර වාසස්ථානය වෙනස් කර පැමිණි මව්පියන්/ නීත්‍යානුකූල භාරකරුවන්ගේ දරුවන්

14.1 (අ) 2 වන ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණිය දක්වා එක් පන්තියක ශිෂ්‍ය සංඛ්‍යාව 40කට සීමා කළ යුතු අතර දැනටමත් එම පන්තිවල සිසුන් සංඛ්‍යාව 40 හෝ 40 ඉක්මවා සිටිත් නම් එම පන්තිවලට අලුතින් ළමයින් ඇතුළත් නොකළ යුතු ය.

(ආ) 6 වන ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා එක් පංතියක ශිෂ්‍ය සංඛ්‍යාව 45 කට සීමා කළ යුතු අතර දැනටමත් එම පංතිවල සිසුන් සංඛ්‍යාව 45 හෝ 45 ඉක්මවා තිබේ නම් එම පංතිවලට අලුතින් සිසුන් ඇතුළත් නොකළ යුතු ය.

14.2 පාසලක පන්තියක/ පන්තිවල පුරප්පාඩු පවතින්නේ නම්, පාසල විසින් තමන්ට ලැබී ඇති ඉල්ලුම්පත් ඉදිරිපත් කළ අයගෙන් සුදුස්සන් තෝරා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් පත් කර ගත යුතු ය.

14.3 ඉහත 14.2 හි සඳහන් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පහත සඳහන් අයුරින් සකස් විය යුතු ය.

i. විදුහල්පති
ii. නියෝජ්‍ය විදුහල්පති

iii. අදාළ අංශ ප්‍රධානියා

14.4 දෙමාපියන්/ නීත්‍යානුකූල භාරකරුවන් විසින් ඉල්ලුම්පත්‍රය සම්පූර්ණ කිරීමේ දී අංක 12 උපලේඛනයෙහි සඳහන් නිර්නායකවලට අනුව තමන්ට හිමි විය යුතු ලකුණු සංඛ්‍යාව අදාළ කොටුවල සඳහන් කළ යුතුයි.

14.5 සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් අයදුම්කරුවන් ඉල්ලුම්පත්‍රයෙහි සඳහන් කර ඇති ලකුණු නිවැරදි බව අයදුම්කරුවන් විසින් ඉදිරිපත් කරනු ලබන අදාළ ලිපි ලේඛනවල මුල් පිටපත් පරීක්ෂා කර බලා සනාථ කර ගත යුතුයි.

14.6 පුරප්පාඩුවලට අනුව ඇතුළත් කිරීමට සුදුසුකම් ලබන සිසුන් අයදුම් පත්‍රයේ තමන් සඳහන් කර ඇති අදාළ පදිංචි ස්ථානයේම පදිංචි ව සිටි ද යන්න සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය මඟින් පරීක්ෂා කර බලා තහවුරු කර ගත යුතු ය.

14.7 යම් අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු සාවද්‍ය බව ඔප්පු වුවහොත් එම අයදුම්කරු ලේඛනයෙන් ඉවත් කර ඒ වෙනුවට ඊළඟට වැඩි ලකුණු ලබා ඇති අයදුම්කරුගේ දරුවා තෝරා ගත යුතු ය.

14.8 සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ලබා ගන්නා ලකුණු අනුව සකස් කරනු ලබන ප්‍රමුඛතා ලේඛනයෙන් පාසලේ පවතින පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් ලබන සිසුන් පිළිබඳ තොරතුරු ඔවුන් ලබාගත් ලකුණු ප්‍රමාණය ද සමඟ පාසල් දැන්වීම් පුවරුවේ දෙසතියක කාලයක් ප්‍රදර්ශනය කළ යුතු ය. ප්‍රදර්ශනය කෙරෙන ලේඛනයේ සඳහන් පරිදි සුදුසුකම් ලද සිසුන් පිළිබඳ ව යම් විරෝධතාවක් වුවහොත් ලේඛනය ප්‍රසිද්ධ කරන ලද දින සිට දෙසතියක් ඇතුළත ජාතික පාසලක් නම් ජාතික පාසල් අධ්‍යාපන අධ්‍යක්ෂකට ද පළාත් පාසලක් නම් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකටද අභියාචනාවක් ඉදිරිපත් කළ හැකි ය.

14.9 පාසලේ පවතින පුරප්පාඩු අනුව තෝරා ගැනීමට සුදුසුකම් ලබන සිසුන්ගේ නාම ලේඛණය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සියලු ම සාමාජිකයන් ගේ අත්සන් සහිත ව ජාතික පාසලක් නම් අධ්‍යාපන අමාත්‍යාංශයේ ජාතික පාසල් අධ්‍යාපන අධ්‍යක්ෂකගේ අනුමැතියට ද පළාත් පාසලක් නම් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකගේ අනුමැතියට ද ඉදිරිපත් කළ යුතු ය. එම ලේඛණය සමඟ සම්මුඛ පරීක්ෂණය සඳහා ඉදිරිපත් වූ අපේක්ෂකයන් ලබාගත් ලකුණු පිළිබඳ විස්තර ද ඉදිරිපත් කළ යුතු ය.

14.10 6 ශ්‍රේණියට ශිෂ්‍යත්වධාරීන් ඇතුළත් කරනු ලබන ආසන්න අවුරුදු 3ක් ඇතුළත අවම ලකුණු තීරණය වූ පාසල්වල 5 ශ්‍රේණියට සිසුන් ඇතුළත් කිරීම කිසිසේත් ම නොකළ යුතු ය.

14.11 තෝරා ගැනීමේ දී :-

i. පෞද්ගලික වාසස්ථානයෙන් බැහැරව වාසය කිරීමට සිදුවන පාර්ලිමේන්තුවට තේරී ඇති නියෝජිතයන්ගේ දරුවන් පාසලේ පුරප්පාඩු තිබේ නම් ඇතුළත් කර ගත යුතු ය.

ii. ස්ථාන මාරුවීම් ලැබ පාසල පිහිටි ප්‍රදේශයේ පදිංචියට පැමිණි නිලධරයන්ගේ දරුවන් හා සැබැවින් ම පාසල පිහිටි ප්‍රදේශයට තම පදිංචිය වෙනස් කළ අයගේ දරුවන් තෝරා ගැනීමේ දී උපලේඛණ අංක 12 දී සඳහන් නිර්නායක හා ලකුණු ක්‍රමය අනුගමනය කළ යුතු ය.

## **IV** කොටස

<u>හයවැනි ශ්‍රේණියට සිසුන් ඇතුළත් කිරීම.</u>

15.0 තම පාසලේ සිසුන් හා පෝෂිත පාසල්වලින් ඇතුළත් වන සිසුන්ට අමතර ව 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්වධාරීන් පාසල්වල 6 ශ්‍රේණියට ඇතුළත් කිරීම පිළිබඳ සියලු විධිවිධාන මෙම අමාත්‍යාංශයේ පාසල් කටයුතු ශාඛාවේ අධ්‍යාපන අධ්‍යක්ෂ මඟින් පමණක් සිදු කරනු ලබන බව අවධාරණය කරනු ලැබේ.

16.0

(අ) පස්වැනි ශ්‍රේණි ශිෂ්‍යත්වධාරීන් ඇතුළත් කරනු ලබන පාසල්වල, එකී ශිෂ්‍යත්වධාරීන් ඇතුළත් කිරීමෙන් පසු ව හා නම් කරන ලද පෝෂිත පාසල්වල ළමයින් ඇතුළත් කිරීමෙන් පසුව 6 වැනි ශ්‍රේණියේ තවදුරටත් ඇබෑර්තු තිබේ නම්, එකී ඇබෑර්තු පිරවීම සඳහා විදුහල්පති විසින් ඉල්ලුම්පත් කැඳවීම කළ යුතු ය. පාසලට ඉදිරිපත් කෙරෙන ඉල්ලුම්පත් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් පවත්වන ලද අදාළ වර්ෂයේ 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගයේ දී ඒ ඒ සිසුන් ලබා ගත් ලකුණු ප්‍රමුඛතා අනුපිළිවෙළ අනුව පෙළ ගස්වා ඇබෑර්තු සංඛ්‍යාව ද පැහැදිලි ව සඳහන් කොට පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගේ (ජාතික පාසලක් නම් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මඟින් මෙම අමාත්‍යාංශයේ පාසල් කටයුතු ශාඛාවේ අධ්‍යාපන අධ්‍යක්ෂ ගේ ) අනුමැතිය වාර්ෂික ව ලබා ගත යුතු ය.

(ආ) අනුමැතියට ඉදිරිපත් කරන ලේඛණය පහත සඳහන් ආකෘතියට අනුව සකස් කර තිබිය යුතුය.

පාසලේ නම :-

පුරප්පාඩු සංඛ්‍යාව :-

| අනු අංකය | විභාග අංකය | නම හා ලිපිනය | ලකුණු (ප්‍රමුඛතා අනුව) |
|---|---|---|---|
| | | | |

. . . . . . . . . . . .. . . . . .

විදුහල්පතිගේ අත්සන

(ඇ) ප්‍රාථමික අංශය නොමැති නම් හා නම් කරන ලද පෝෂිත පාසල් නොමැති කල්හි ආදී ශිෂ්‍ය/ ශිෂ්‍යාවන්ගේ දරුවන්ට හා අදාළ පාසලේ දැනට අධ්‍යාපනය ලබන සිසුන්ගේ සහෝදර සහෝදරියන්ට හා පාසල පිහිටි අධ්‍යාපන කලාපය තුළ පාසල් අධ්‍යාපනයට සෘජු ව ම බලපාන ආයතනවල සේවය කරන කාර්යමණ්ඩලවලට අයත් තැනැත්තන්ගේ දරුවන්ට අනුග්‍රහයක් ලෙස කණ්ඩායම් තුනට ම 6 ශ්‍රේණියට ඇතුළත්වීම සඳහා පාසලේ පුරප්පාඩුවලින් 15%ක් ලබාදිය යුතු ය. (මෙය ආදී ශිෂ්‍ය/ ශිෂ්‍යාවන්ගේ දරුවන් 7.5%ක් ද දැනට එම පාසලේ අධ්‍යාපනය ලබන සිසු/ සිසුවියන්ගේ සහෝදර/ සහෝදරියන් 5%ක් ද අධ්‍යාපන කලාපය තුළ පාසල් අධ්‍යාපනයට සෘජු ව ම බලපාන ආයතනවල සේවය කරන කාර්ය මණ්ඩලවලට අයත් තැනැත්තන්ගේ දරුවන් 2.5% ද වශයෙන් විය යුතු යි).

(ඈ) මෙම 15% අනුග්‍රහය ලැබිමට සුදුසුකම් ඇති ළමයින්ගේ දෙමව්පියන් විසින් අදාළ පාසලට ඇතුළත් කිරීම සඳහා 5 ශ්‍රේණී ශිෂ්‍යත්ව ප්‍රතිඵල නිකුත් වී මසක් ඇතුළත තම අයදුම්පත් ලියාපදිංචි තැපැලෙන් එම විදුහලේ විදුහල්පති වෙත යැවිය යුතු ය. විදුහල්පති විසින් එසේ තම විදුහලට ලැබෙන ඉල්ලුම්පත් ලබා ගෙන ලකුණු ප්‍රමුඛතාවය අනුව ගණ තුනට ම වෙන් වෙන් ව ඉහත (ආ) අනුව ලේඛන සකස් කර මෙම අමාත්‍යාංශයේ පාසල් කටයුතු අධ්‍යක්ෂ වෙත පිටපත් 02කින් එවිය යුතු ය. ලකුණු ප්‍රමුඛතා අනුව තෝරා ගන්නා සිසුන්ගේ ලේඛණය පාසල් කටයුතු අධ්‍යක්ෂ විසින් පාසලට ඉන් පසුව එවනු ඇත.

17.0 (අ) රජයේ සේවකයකු රජයේ අවශ්‍යතාව මත පාසල පිහිටි ප්‍රදේශයට ස්ථාන මාරු ලබා පැමිණෙන අවස්ථාවන් හි දී එම නිලධාරීන්ගේ දරුවන්ට 6 ශ්‍රේණිය සඳහා ශිෂ්‍යත්ව විභාග ලකුණු පාදක කොට පුරප්පාඩු අනුව පාසල් ලබාදෙනු ඇත. එසේ නොවන අවස්ථාවන් හිදි අවම ලකුණු සීමාවන් තීරණය නොවූ පුරප්පාඩු සහිත පාසල්වලට ඇතුළත් කළ හැකි ය

(ආ) යම් තැනැත්තෙක් රාජ්‍ය සේවා අවශ්‍යතා මත විදේශයන්හි සේවය කර මෙරටට පැමිණ 6 වන ශ්‍රේණියට ඇතුළත් විම සඳහා කිසිවකු ඉල්ලුම් කරන අවස්ථාවක දි පහත සඳහන් කරුණු පිළිබඳ ව සැලකිල්ලට ගත යුතු වේ.

i. අදාළ සිසුවා / සිසුවිය විදෙස් ගතවිමට පෙර මෙරට පාසලක ඉගෙනුම ලබා ඇත්ද යන වග හා එසේ අධ්‍යාපනය ලබා තිබේ නම් එම පාසලට හෝ ඒ හා සමාන පාසලකට පුරප්පාඩු ඇත්නම් ඇතුළත්විමට අවස්ථාව සැලසීම

ii. මෙරට පාසලක දි අධ්‍යාපනය ලබා නොමැති විටක දි අදාළ දරුවාගේ දැනුම මෙරට 6 වන ශ්‍රේණියේ දැනුමට සමාන වන බව අවම ලකුණු සිමාවන් තීරණය නොවූ විදුහලේ විදුහල්පති විසින් තහවුරු කර ගැනිමෙන් අනතුරු ව එම විදුහල්වලට පුරප්පාඩු ඇත්නම් පමණක් ඇතුළත් කිරීමට ඉඩ කඩ සලසාදීම.

(ඇ) 5 වැනි ශ්‍රේණිය දක්වා පමණක් පන්ති ඇති පාසල්වල 5 වැනි ශ්‍රේණිය සමත් වන සියලු ම සිසුන්ට පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයා/කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් විකල්ප පාසල් ලබා දිය යුතු ය.

## V කොටස

<u>අ.පො.ස (උ.පෙ.) (12 ශ්‍රේණිය) පන්තිවලට සිසුන් ඇතුළත් කිරීම.</u>

18.0 සාමාන්‍ය සුදුසුකම්

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙ.) විභාගයේ දී මාධ්‍ය භාෂාව හා ගණිතය ඇතුළු හර විෂයයන් 6 කින් සමත් විය යුතු අතර, ඉන් අවම වශයෙන් විෂයයන් තුනකට සම්මාන සාමාර්ථය ලබා තිබිය යුතු ය. ඉහත සඳහන් සුදුසුකම් සපුරාලීම සඳහා අතිරේක විෂයයන්ගෙන් ලබන සමාර්ථ හෝ සම්මාන සමාර්ථ හෝ යොදා ගත නොහැකි ය.

(ආ) මෙම සුදුසුකම් වරක දී හෝ දෙවරක දී වුව ද ලබා ගත හැකි ය. දෙවරකදී ලබා ගැනිමේදී

i. දෙවරක දී මෙම සුදුසුකම් ලබා ගන්නා ශිෂ්‍යයකු ඉන් මුල් ප්‍රයත්නයේ දී සම්මාන සාමාර්ථ 3ක් සහිත ව මාධ්‍ය භාෂාව, හා/හෝ ගණිතය ඇතුලු ව හර විෂයයන් 5කින් සමත් වි තිබිය යුතු ය.

ii. මුල් ප්‍රයත්නයේ දී සම්මාන සාමාර්ථ 03ක් සහිතව මාධ්‍ය භාෂාව හා/ හෝ ගණිතය ඇතුළුව හර විෂයයන් 5ක් සමත් වී ඊළඟ වසරේ පැවැත්වෙන අ.පො.ස (සා.පෙ) විභාගයේ දී ම නියමිත සුදුසුකම් සම්පූර්ණ කර ගැනීමේ කොන්දේසිය මත තාවකාලික ව අ.පො.ස. (උ.පෙ) පන්තියට ඇතුළත් කර ගත හැකි ය. එසේ ඇතුළත් කරගනු ලබන ශිෂ්‍යයකු ඉහත සඳහන් කර ඇති සුදුසුකම් ඊළඟ වසරේම ලබා නොගතහොත් පාසලින් අස්කරනු ලැබීමට යටත් වේ.

(ඇ) ඉහත (අ) සහ (ආ) කොටස්වල දැක්වෙන අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් යටතේ අවශ්‍ය වන සම්මාන සාමාර්ථ තුනෙන් එකක් නොමැති අවස්ථාවක පමණක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන ජාතික මට්ටමේ ලිඛිත පරීක්ෂණයේ සාමාන්‍ය සාමාර්ථයක් ලබා එම විෂයට ම පාසල පදනම් කරගත් ඇගයීම් වැඩපිළිවෙළ යටතේ සම්මාන හෝ ඊට ඉහළ සාමාර්ථයක් ලබා ඇත්නම් එය එක් සම්මාන සාමාර්ථයක් ලෙස සලකනු ලැබේ. එහෙත් මෙය මාධ්‍ය භාෂාව හා ගණිතය යන විෂයයන් සඳහා වන සම්මාන සාමාර්ථ අවශ්‍යතාවන්ට අදාළ නොවේ.

(ඈ) දෙවන වරට පෙනී සිටින සිසුවකුටද ඉහත (ඇ) ඡේදය අනුව සම්මාන සාමාර්ථ සපුරා ගත හැකිය. එයට මුල් ප්‍රයත්නයේදි ලබාගත් පාසල් පාදක ඇගයීම් ප්‍රතිඵල යොදා ගත හැකිය.

18.1 අ.පො.ස. (උ.පෙ) විෂය ධාරාවන්ට ඇතුළත් වීම සඳහා අවශ්‍ය විශේෂ සුදුසුකම්

ඉහත සඳහන් සාමාන්‍ය සුදුසුකම්වලට අතිරේක ව ඒ ඒ විෂය ධාරාවන්ට ඇතුලු වීම සඳහා පහත සඳහන් අනු ඡේදයන්හි දක්වා ඇති විශේෂ සුදුසුකම් ද, එක ම විභාගයේ දි ලබා තිබිය යුතු ය.

(අ) කලා අංශය

1. කලා විෂය ධාරාව

18.0(අ) උප ඡේදයේ සඳහන් කර ඇති සම්මාන සාමාර්ථ තුන අතුරෙන් යටත් පිරිසෙයින් එකක්වත් අ.පො.ස. (උ.පෙ) විභාගය සඳහා තෝරා ගන්නා විෂයයක් විය යුතු ය. ආර්ථික විද්‍යාව, දේශපාලන විද්‍යාවේ මූලධර්ම, ඉතිහාසය, භූගෝල විද්‍යාව, තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය යන කවර හෝ විෂයයක් හැදෑරීම සඳහා අවශ්‍ය සම්මාන සාමාර්ථය අ.පො.ස. (සා.පෙ) විභාගයේ දී සාමාජ අධ්‍යයන විෂයයට සම්මාන සාමාර්ථයක් ලබා ගැනීමෙන් සපුරාලිය හැකි ය.

සෞන්දර්යය විෂයයන් හැදෑරීමට නම් නියමිත සම්මාන සාමාර්ථ තුනෙන් එකක් චිත්‍ර කලාවට හෝ සංගීතයට හෝ නැටුම්වලට හෝ නාට්‍ය හා රංග කලාව හෝ විය යුතු ය. (සෞන්දර්ය විෂයය හැදෑරීම සඳහා අවශ්‍යවන සම්මාන සාමාර්ථ හි අවශ්‍යතාවය ඉහත 18.0 (ඇ) අනුව ද සපුරාගත හැකි ය.)

11. වාණිජ විෂය ධාරාව

නියමිත සම්මාන තුනෙන් එකක් ව්‍යාපාර හා ගිණුම්කරණයට, ගණිතයට හෝ සමාජ අධ්‍යයනයට හෝ විය යුතු ය.

සැ.යු – සිංහල, දෙමළ, ඉංග්‍රීසි හෝ බුද්ධ ධර්මය, හින්දු ධර්මය, ඉස්ලාම් ධර්මය, ක්‍රිස්තු ධර්මය (රෝ.ක) ක්‍රිස්තු ධර්මය (රෝ.ක.නොවන) යන කවර හෝ විෂයයක් ඉහත සඳහන් විෂය ධාරාවන් යටතේ හැදෑරීමට බලාපොරොත්තු වන ශිෂ්‍යයෙකු අ.පො.ස.(සා.පෙ) විභාගයේ දී එම විෂයයට සම්මාන සාමාර්ථයක් ලබා තිබිය යුතු ය.

(ආ) විද්‍යා අංශය

නියමිත සම්මාන තුනෙන් එකක් විද්‍යාව හා තාක්ෂණවේදය හෝ ගණිතය හෝ විය යුතු ය. තවද, විද්‍යාව හා තාක්ෂණවේදය සහ ගණිතය විෂයයන් දෙකෙන් ම සමත් වී තිබිය යුතු ය.

1. භෞතිය විද්‍යා විෂය ධාරාව

මෙම විෂය ධාරාව හැදෑරීම සඳහා ගණිතය විෂයයට සම්මාන සාමාර්ථයක් තිබිය යුතු අතර විද්‍යාව හා තාක්ෂණවේදය විෂය සමත් තිබිය යුතු ය.

11. ජෛවීය විද්‍යා විෂය ධාරාව

මෙම විෂය ධාරාව හැදෑරීම සඳහා විද්‍යාව හා තාක්ෂණවේදය විෂයයට සම්මාන සාමාර්ථයක් තිබිය යුතු අතර ගණිතය විෂය සමත් වී තිබිය යුතු ය.

18.2 දොළොස්වැනි ශ්‍රේණියට ඇතුළත් වීමෙන් පසුව තමන් තෝරා ගත් විෂය ධාරාව වෙනස් කිරීමට ඉල්ලා සිටින ශිෂ්‍යයකුට එම වර්ෂය තුළ දී (12 ශ්‍රේණියේ දී පමණක්) අවශ්‍ය සුදුසුකම් හා පංතිවල පුරප්පාඩු තිබේනම් එසේ කිරීමට ඉඩ දිය හැකි ය. එසේ ඉඩ දෙනු ලබන්නේ අ.පො.ස.(උ.පෙ) පන්තිවල රැඳී සිටීමට උපරිම වශයෙන් ශිෂ්‍යයකුට ලැබෙන කාල සීමාව වර්ෂ තුනක් පමණක් ය යන කොන්දේසිය මත ය. අනතුරු ව පැවැත් වු අ.පො.ස.(සා.පෙ) විභාගයක ප්‍රතිඵල මත විෂය ධාරාව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

18.3 ඉහත දක්වා ඇති සුදුසුකම් නියම කර ඇත්තේ අ.පො.ස. (උ.පෙ) පන්තිවලට ඇතුළත් කිරීම සඳහා පමණක් බව පාසල් ප්‍රධානීන් අවධානයට ගත යුතු ය. උසස් පෙළ විෂය ධාරාවන්හි දි ඒ ඒ විෂය ධාරාවට අදාළ විෂයයන් තෝරා ගැනීම සම්බන්ධයෙන් මෙම අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති විශ්ව විද්‍යාල ප්‍රවේශය පිළිබඳ අ.පො.ස(උසස් පෙළ) විෂය සංයෝජනය චක්‍රලේඛ නියමයන් අනුව සිය ශිෂ්‍යයන්ට උපදෙස් දීම පාසල් ප්‍රධානින්ගේ වගකිම වේ.

## 19.0 අ.පො.ස. (උසස් පෙළ) පන්තිවලට සිසුන් ඇතුළත් කිරිමේ ප්‍රමුඛතාව

19.1 අ.පො.ස. (උ.පෙ) පන්තිවලට සිසුන් ඇතුළත් කිරීම සඳහා තෝරා ගැනීමේ ප්‍රමුඛතාව පහත දැක්වෙන අයුරු වේ.

(අ) එම පාසලේ ඉගෙනුම ලබන සිසුන් (චක්‍රලේඛයේ 18.0 වගන්තිය යටතේ සඳහන් එක් එක් විෂයධාරාවට තිබිය යුතු අවම සුදුසුකම් සපුරා තිබේ නම් ඔවුන් එම විෂයධාරාව ඉල්ලුම් කළහොත් එය අනිවාර්යයෙන් ම ලබාදිය යුතු ය.)

(ආ) අ.පො.ස (උ.පෙ) පන්ති නොමැති රජයේ පාසල්වලින් හෝ අදාළ විෂය ධාරා නොමැති රජයේ පාසල්වලින් පැමිණෙන සිසුන්

(ඇ) උසස් පෙළ පන්තියට ඇතුළත් වීමට සුදුසුකම් ලබා ඇති මැයි මස 01 වැනි දිනට වයස අවුරුදු 18ට අඩු වෙනත් සිසුන්

(ඈ) පිළිගත හැකි සාධාරණ හේතු ඉදිරිපත් කරන විෂයධාරා තිබෙන රජයේ පාසල්වල සිසුන්

(ඉ) අ.පො.ස. (සා. පෙළ) විභාගයට සමාන්තර සුදුසුකම් සහිත ප්‍රතිඵල ලබා ඇති (අපගේ විෂය සංයෝජනයට අනුකූල වන පරිදි) වයස අවු. 18 ට අඩු විදේශගත ව සිට පැමිණෙන සිසුන් (සහතිකවල සමාන්තර භාවය පැහැදිලි නොවන විට අමාත්‍යාංශ ලේකම්ගේ උපදෙස් අනුව කටයුතු කළ යුතු යි.) අ.පො.ස. (උ.පෙ) පංති නොමැති හෝ අදාළ විෂයධාරා නොමැති ජාත්‍යන්තර පාසල්, පෞද්ගලික පාසල් සිසුන්.

19.2 අ.පො.ස. උසස් පෙළ පන්තියට ඇතුළත්වීමට සුදුසුකම් ලබා ඇති අදාළ අවුරුද්දේ මැයි 01 දිනට වයස අවුරුදු 18ට වැඩි සිසුන් පිළිගත හැකි හේතු සහිත ව ඇතුළත් කිරීමට කරන ඉල්ලීම් පළාත් පාසල් සම්බන්ධයෙන් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ ද ජාතික පාසල් සම්බන්ධයෙන් මෙම අමාත්‍යාංශයේ ලේකම් ද තිරණය කරනු ඇත.

19.3 ඉහත 19.1 වගන්තියේ (ආ) සිට (ඉ) දක්වා උපවගන්තියන්ට අනුව අ.පො.ස. (උ.පෙ) පන්තියට ඇතුළු වීම සඳහා ඉදිරිපත් කරනු ලබන සියලු ම අයදුම්පත් ලේඛනගත කොට උපලේඛන අංක 13 හි සඳහන් ලකුණු දීමේ ක්‍රමය අනුව තෝරා ගැනීම කළ යුතු ය. ලකුණු දීමේ ක්‍රමය අ.පො.ස (සා.පෙ) ප්‍රතිඵල හා විෂයානුබද්ධ ක්‍රියාකාරකම් පදනම් කරගෙන සකස් කර ඇත. එම උපදෙස් අනුව කටයුතු කිරීම පිළිබඳ සම්පූර්ණ වගකීම පාසල් ප්‍රධානින් වෙත පැවරේ.

19.4 අ.පො.ස (උ.පෙ) අදාළ විෂය ධාරා නොමැති පාසල්වලින් සුදුසුකම් ලත් සියලු ම සිසුන්ට අ.පො.ස (උ.පෙ) පන්ති ඇති පාසල්වලට ඇතුලුවීමට ඉඩ සලසා දීම, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ වගකීම වේ.

19.5 අ.පො.ස උසස් පෙළ පන්තියකට ඇතුළත් කළ හැකි උපරිම ශිෂ්‍ය සංඛ්‍යාව 35කි.

## 20.0 පහසුකම් සහිත දිස්ත්‍රික්කවලින් දුෂ්කර දිස්ත්‍රික්කයන්හි පාසල්වලට අ.පො.ස. (උ.පෙ) පංතිවලට ඇතුළත් කිරිම

(අ) විශ්ව විද්‍යාල ප්‍රවේශයේ දී නම්කර ඇති දුෂ්කර දිස්ත්‍රික්කයන්ට ලබා දී ඇති සහනය වංක ලෙස ලබාගැනිමේ අරමුණින් පහසුකම් සහිත දිස්ත්‍රික්කවලින් අ.පො.ස. (සාමාන්‍ය පෙළ) සමත් වී දුෂ්කර දිස්ත්‍රික්ක තුළ උසස් පෙළ පංති සහිත පාසල්වලට ඇතුළත්වීමට උත්සාහ කරන සිසුන්ට ඉඩ නොදිය යුතුය.

(ආ) එහෙත් පහත සඳහන් විශේෂිත හේතුන් මත එවැනි ඉල්ලීමක් ඉදිරිපත් වුවහොත් ඒ පිළිබඳ සලකා බැලිය යුත්තේ ලිපිලේඛන ඉදිරිපත් කර අදාළ කරුණු තහවුරු කරන්නේ නම් පමණි.

i. රජයේ අවශ්‍යතා මත දෙමාපියන්ගේ ස්ථාන මාරු හේතු කොට :
මේ හේතුවෙන් ඇතුළත්විම සිදුකළ යුතු වන්නේ ස්ථාන මාරුවීම සමඟ තම පදිංචිය ද නව සේවා ස්ථානයට ආසන්න ප්‍රදේශයකට සත්‍ය වශයෙන් ම වෙනස්කර තිබේ නම් පමණි. එසේ පදිංචිය වෙනස්කර

තිබීම පිළිබඳව අදාළ ලිපි ලේඛන තම ආයතන ප්‍රධානියාගෙන් ද අදාළ ප්‍රදේශයන්හි ග්‍රාම නිලධාරීගෙන් ද සහතික කර දෙමාපියන් විසින් ඉදිරිපත් කළ යුතු ය.

ii. ආරක්ෂිත හේතූන් මත :
මෙම හේතුවෙන් දෙමව්පියන්ගේ පදිංචිය වෙනස් කිරීමක් සිදුකර ඇත්නම්, ආරක්ෂාව සඳහා පදිංචිය වෙනස් කර ඇති බවට අදාළ ප්‍රදේශයේ පොලිස් ස්ථානාධිපතිවරයාගේ ලබා ගත් සහතික ඉදිරිපත් කළ යුතුය.

(ඇ) මීට අමතරව සත්‍ය වශයෙන් ම අදාළ ප්‍රදේශයේ පදිංචි වී සිටින බව විදුහල්පති විසින් පදිංචි ස්ථානයට ගොස් පරීක්ෂාකර සනාථ කර ගත යුතු ය.

21.0 අ.පො.ස.(උ.පෙ) පන්තිවල ඉගෙනුම කළ හැකි කාල සීමාව

(අ) අ.පො.ස. (උ.පෙ) පාඨමාලාව 12 වැනි ශ්‍රේණිය සහ 13 වැනි ශ්‍රේණිය යනුවෙන් දෑවුරුදු කාල සීමාවකට සීමාවේ.

(ආ) දහතුන්වැනි ශ්‍රේණියේ සෑම ශිෂ්‍යයකුම එම වසර අවසානයේ දී, නියම කර ඇති මූලික අවශ්‍යතා සපුරා ඇත්නම් අ.පො.ස. (උ.පෙ) විභාගයට ඉදිරිපත් කළ යුතු ය.

(ඇ) ශිෂ්‍යයකු තමා විශ්ව විද්‍යාලයේ දී හැදෑරීමට බලාපොරොත්තු වන පාඨමාලාව සඳහා තෝරා නොගතහොත් දහතුන්වැනි ශ්‍රේණියේ පාඨමාලාව නැවත එක් වරක් පමණක් හැදෑරීමට අවසර දිය හැකි ය. එහෙත් අ.පො.ස (උ.පෙ) පන්තිවල රැඳී සිටීමට උපරිම වශයෙන් ශිෂ්‍යයකුට ලැබෙන කාල සීමාව වර්ෂ තුනක් බව සැලකිය යුතු යි.

22.0 2005 වර්ෂයේ සිට උසස් පෙළ විභාගයට පෙනී සිටින පාසල් අයදුම්කරුවන් සඳහා පාසල පදනම්කරගත් ඇගයීම් ක්‍රියාවලිය අනිවාර්ය කොට ඇත. උසස් පෙළ විභාගයට පෙනී සිටින බාහිර අයදුම්කරුවන් සඳහා ද මීට සමාන්තර විකල්ප ඇගයීම් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක වේ. ඒ සඳහා විභාගයට පෙනී සිටින වර්ෂයට පෙර වර්ෂයේ මාර්තු 30ට පෙර අදාළ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවල ලියාපදිංචි විය යුතු ය. මේ පිළිබඳ ව සෑම වර්ෂයක ම ජනවාරි මාසයේ බාහිර අයදුම්කරුවන් දැනුවත් කරනු ඇත. මෙම විකල්ප ක්‍රියාවලිය සම්බන්ධ ව අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතු වේ.

23.0 පොදු කරුණු

(අ) පිළිගත හැකි හේතුවක් නොමැති ව ජාතික පාසලකින් ජාතික පාසලකට ළමයින් ඇතුළත් නොකළ යුතු ය. (5 ශ්‍රේණී ශිෂ්‍යත්වධාරීන් හැර) මේ සම්බන්ධයෙන් යම්කිසි පාසලක ශිෂ්‍යයෙකුට හෝ ශිෂ්‍යාවකට හෝ අසාධාරණයක් වන්නේ යැයි අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් නිගමනය කළ අවස්ථාවක දී ඒ පිළිබඳ ව සුදුසු පරිදි තීරණයක් ගැනීමේ බලය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා සතු ය.

(ආ) විදේශගත ව සිට පැමිණෙන ළමයෙකු ඒ රටේ අධ්‍යාපනය ලැබූ පන්තිය හෝ ශ්‍රේණිය ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රමයේ පන්ති (ශ්‍රේණි) ක්‍රමයට සමාන්තර නොවන විට ඒ ළමයාගේ වයස සීමාවත්, ප්‍රවීණතාවත් සලකා සුදුසු පන්තියකට ඇතුළත් කිරීම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් (ජාතික පාසලක් නම් ජාතික පාසල් අධ්‍යාපන අධ්‍යක්ෂ) විසින් පරීක්ෂා කර බැලීමෙන් පසු සිදු කරනු ඇත.

(ඇ) ත්‍රස්තවාදී ක්‍රියා හේතු කොට ගෙන හෝ ස්වභාවික ව්‍යසනයක් හේතු කොට ගෙන අවතැන් වූ පවුල්වල දරුවන් පාසල්වලට ඇතුළත් කිරීමේ දී උප්පැන්න සහතික, අස්වීමේ සහතික ආදිය ද නොමැති වූ විට, එකී පවුල් ත්‍රස්තවාදී ක්‍රියාවලට භාජන වූ බවට/ ස්වභාවික ව්‍යසනයකට පත්වූ බවට ග්‍රාම නිලධාරී සහතිකය, අනාථ කඳවුරු සහතිකය ආදිය සලකා බලා සුදුසු පරිදි අදාළ ශ්‍රේණියට ඇතුලු කර ගැනීමට කටයුතු කළ යුතු ය. උප්පැන්න සහතිකය ඉදිරිපත් කළ නොහැකි අවස්ථාවන්හි දී උපන් දිනය සනාථ කිරීම සඳහා දිවුරුම් ප්‍රකාශයක් ලබාගත හැකිය.

iii. ආරක්ෂිත හේතූන් මත :
මෙම හේතුවෙන් දෙමව්පියන්ගේ පදිංචිය වෙනස් කිරීමක් සිදුකර ඇත්නම්, ආරක්ෂාව සඳහා පදිංචිය වෙනස් කර ඇති බවට අදාළ ප්‍රදේශයේ පොලිස් ස්ථානාධිපතිවරයාගේ ලබා ගත් සහතික ඉදිරිපත් කළ යුතුය.

(ඇ) මීට අමතරව සත්‍ය වශයෙන් ම අදාළ ප්‍රදේශයේ පදිංචි වී සිටින බව විදුහල්පති විසින් පදිංචි ස්ථානයට ගොස් පරීක්ෂාකර සනාථ කර ගත යුතු ය.

21.0 අ.පො.ස.(උ.පෙ) පන්තිවල ඉගෙනුම කළ හැකි කාල සීමාව

(අ) අ.පො.ස. (උ.පෙ) පාඨමාලාව 12 වැනි ශ්‍රේණිය සහ 13 වැනි ශ්‍රේණිය යනුවෙන් දෑවුරුදු කාල සීමාවකට සීමාවේ.

(ආ) දහතුන්වැනි ශ්‍රේණියේ සෑම ශිෂ්‍යයකුම එම වසර අවසානයේ දී, නියම කර ඇති මූලික අවශ්‍යතා සපුරා ඇත්නම් අ.පො.ස. (උ.පෙ) විභාගයට ඉදිරිපත් කළ යුතු ය.

(ඇ) ශිෂ්‍යයකු තමා විශ්ව විද්‍යාලයේ දී හැදෑරීමට බලාපොරොත්තු වන පාඨමාලාව සඳහා තෝරා නොගතහොත් දහතුන්වැනි ශ්‍රේණියේ පාඨමාලාව නැවත එක් වරක් පමණක් හැදෑරීමට අවසර දිය හැකි ය. එහෙත් අ.පො.ස (උ.පෙ) පන්තිවල රැඳී සිටීමට උපරිම වශයෙන් ශිෂ්‍යයකුට ලැබෙන කාල සීමාව වර්ෂ තුනක් බව සැලකිය යුතු යි.

22.0 2005 වර්ෂයේ සිට උසස් පෙළ විභාගයට පෙනී සිටින පාසල් අයදුම්කරුවන් සඳහා පාසල පදනම්කරගත් ඇගැයීම් ක්‍රියාවලිය අනිවාර්ය කොට ඇත. උසස් පෙළ විභාගයට පෙනී සිටින බාහිර අයදුම්කරුවන් සඳහා ද මීට සමාන්තර විකල්ප ඇගැයීම් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක වේ. ඒ සඳහා විභාගයට පෙනී සිටින වර්ෂයට පෙර වර්ෂයේ මාර්තු 30ට පෙර අදාළ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවල ලියාපදිංචි විය යුතු ය. මේ පිළිබඳ ව සෑම වර්ෂයක ම ජනවාරි මාසයේ බාහිර අයදුම්කරුවන් දැනුවත් කරනු ඇත. මෙම විකල්ප ක්‍රියාවලිය සම්බන්ධ ව අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතු වේ.

23.0 පොදු කරුණු

(අ) පිළිගත හැකි හේතුවක් නොමැති ව ජාතික පාසලකින් ජාතික පාසලකට ළමයින් ඇතුළත් නොකළ යුතු ය. (5 ශ්‍රේණි ශිෂ්‍යත්වධාරීන් හැර) මේ සම්බන්ධයෙන් යම්කිසි පාසලක ශිෂ්‍යයෙකුට හෝ ශිෂ්‍යාවකට හෝ අසාධාරණයක් වන්නේ යැයි අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් නිගමනය කළ අවස්ථාවක දී ඒ පිළිබඳ ව සුදුසු පරිදි තීරණයක් ගැනීමේ බලය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා සතු ය.

(ආ) විදේශගත ව සිට පැමිණෙන ළමයෙකු ඒ රටේ අධ්‍යාපනය ලැබූ පන්තිය හෝ ශ්‍රේණිය ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රමයේ පන්ති (ශ්‍රේණි) ක්‍රමයට සමාන්තර නොවන විට ඒ ළමයාගේ වයස සීමාවත්, ප්‍රවීණතාවත් සලකා සුදුසු පන්තියකට ඇතුළත් කිරීම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් (ජාතික පාසලක් නම් ජාතික පාසල් අධ්‍යාපන අධ්‍යක්ෂ) විසින් පරීක්ෂා කර බැලීමෙන් පසු සිදු කරනු ඇත.

(ඇ) ත්‍රස්තවාදී ක්‍රියා හේතු කොට ගෙන හෝ ස්වභාවික ව්‍යසනයක් හේතු කොට ගෙන අවතැන් වූ පවුල්වල දරුවන් පාසල්වලට ඇතුළත් කිරීමේ දී උප්පැන්න සහතික, අස්වීමේ සහතික ආදිය ද නොමැති වූ විට, එකී පවුල් ත්‍රස්තවාදී ක්‍රියාවලට භාජන වූ බවට/ ස්වභාවික ව්‍යසනයකට පත්වූ බවට ග්‍රාම නිලධාරී සහතිකය, අනාථ කඳවුරු සහතිකය ආදිය සලකා බලා සුදුසු පරිදි අදාළ ශ්‍රේණියට ඇතුළු කර ගැනීමට කටයුතු කළ යුතු ය. උප්පැන්න සහතිකය ඉදිරිපත් කළ නොහැකි අවස්ථාවන්හි දී උපන් දිනය සනාථ කිරීම සඳහා දිවුරුම් ප්‍රකාශයක් ලබාගත හැකිය.

උපලේඛන අංක 01

අයදුම් පත්‍රයේ ආදර්ශ ආකෘතිය

200.............................. වර්ෂයේ දී .................................................................................................... පාසලේ පළමු වන

ශ්‍රේණියට ඇතුළත් කිරීම සඳහා අයදුම් පත්‍රය

**ඉල්ලුම් කරන ගණය / ගණ** ***(ප්‍රමුඛතා අනුව )*** :-

01. ළමයා පිළිබඳ විස්තර :

1.1 සම්පූර්ණ නම :-
(වාසගමට යටින් ඉරක් අඳින්න)

1.2 ස්ත්‍රී /පුරුෂ භාවය :-

1.3 අධ්‍යාපන මාධ්‍යය :-

1.4 උපන්දිනය :-

1.5 200... ජනවාරි 31 දිනට වයස :-
අවුරුදු :- මාස :- දින :-

- ළමයාගේ උප්පැන්න සහතිකයේ ඡායාපිටපතක් තමා විසින් ම සහතික කර මෙයට අමුණා එවිය යුතුය. (මෙය සියලු ම ගණවලට අදාළ ය.)

02. දෙමව්පියන් පිළිබඳ විස්තර : (මව /පියා/නීත්‍යනුකූල භාරකරු)

2.1 සම්පූර්ණ නම :-
2.2 පුරවැසි භාවය :-    2.3 ජාතික හැඳුනුම්පත් අංකය :-
2.4 ආගම :-
2.5 ස්ථිර ලිපිනය :-
නිවාස අංකය :-
වීදිය/මාවත :-
නගරය :-
2.6 ග්‍රාම නිලධාරි කොට්ඨාසය :-
2.7 ඔබ ස්ථාන මාරු ලැබ පැමිණ සිටී නම් එම විස්තර -
2.8 ඔබ පාසලට ඇතුළත් කිරීමට ඉල්ලුම් කරන ළමයා සමග
විදේශගත ව සිට පැමිණ ඇත්නම් එම විස්තර -

03. පදිංචිය පිළිබඳ විස්තර -
3.1 දෙමව්පියන්ගේ/නීත්‍යනුකූල භාරකරුවන් ස්ථිර පදිංචි ස්ථානයේ සිට
පාසල දක්වා ඇති කෙටි ම දුර (ලිපිනය සඳහන් කරන්න)
3.2 ඉහත ලිපිනයෙහි පදිංචිය ආරම්භ කළ දිනය :-
3.3 ඉහත 3.1 යටතේ සඳහන් පදිංචි ස්ථානයට ප්‍රථමයෙන් පදිංචි වී සිටි ස්ථානයේ ලිපිනය :-
3.4 අයදුම්කරු ප්‍රධාන ගෘහ මූලිකයා ද ? :-
3.5 අයදුම්කරු ප්‍රධාන ගෘහ මූලිකයා නොවේ නම්, ගෘහ මූලිකයාට ඇති සබඳකම :-
3.6 ගෘහ මූලිකයා තම පියා හෝ මව හෝ නම් ඔවුන් සමග එක ම නිවසේ පදිංචි බවට ඇති සාක්ෂි :-
(ගෘහමූලික ගණයට ඉල්ලුම් කළ විට ගෘහමූලික බව සනාථ කිරීම සඳහා හිමිකම් ඔප්පුවේ හෝ හිමිකම් පිළිබඳ ප්‍රධාන ලේඛනය තමා විසින් ම සහතික කළ ඡායා පිටපතක් මේ සමග එවිය යුතු ය.)

- තම පදිංචි ස්ථානයේ සිට පාසලට පැමිණෙන මාර්ග සටහන මග සලකුණු ද සමග පැහැදිලි ව සකස් කර අමුණා එවිය යුතු ය.

04. පාසල සමග ඇති සම්බන්ධතා
4.1 අයදුම්කරු සහ/හෝ කලත්‍රයා මෙම පාසලේ ආදි ශිෂ්‍යයකු/ශිෂ්‍යාවක් නම් පාසලෙහි ඉගෙනීම කළ කාල සීමාව. :-
4.2 අයදුම්කරුගේ ළමයකු/ළමයින් මෙම පාසලෙහි ඉගෙනුම ලබමින් සිටින්නේ ද ? :-
එසේ නම් ඔහුගේ/ඔවුන්ගේ නම /නම් :-
ඉගෙනුම ලබන ශ්‍රේණිය/ශ්‍රේණි :-
4.3 අයදුම්කරු සහ/ හෝ කලත්‍රයා පාසල් අධ්‍යාපනයට සෘජු ව ම බලපාන ආයතනයක කාර්ය මණ්ඩලයේ ස්ථිර තනතුරක නියුක්ත වූවකු ද :-
එසේ නම් සේවා කාලය :-

05. අනිකුත් අදාළ තොරතුරු -
5.1 පාසල් යන අනෙක් ළමයින් පිළිබඳ විස්තර :- (ඔවුන්ගේ නම්, ඔවුන් ඉගෙන ගන්නා පාසල් සහ ශ්‍රේණි සඳහන් කරන්න.)

5.2 ඔබ පදිංචි ස්ථානයට ආසන්න තවත් පාසල් 03ක් නම් කරන්න.
i.
ii.
iii.

5.3 ඉහත 5.3 හි සඳහන් පාසල් අතරින් ඔබ ඉල්ලුම්පත් යැවූ පාසල් නම් කරන්න.
i.
ii.
iii.

5.4 වෙනත් අදාළ විස්තර -

06. එක් එක් ගණ සඳහා ලබා දී ඇති ලකුණු ක්‍රමයට අනුව තමන් ලබා ගන්නා ලකුණු ගණනය කොට එම ලකුණු පහත සඳහන් වගුවේ සටහන් කරන්න

| ගණය | ලකුණු |
|---|---|

| | |
|---|---|
| 1. ගෘහ මූලික<br>2. ආදි ශිෂ්‍යය<br>3. දැනට අදාළ පාසලේ දරුවන් සිටින මව්පියන්ගේ දරුවන්<br>4. ස්ථාන මාරුවීම් ලැබූ නිලධාරීන්ගේ දරුවන් හා වෙනත්<br>5. ගෘහ මූලික නොවන<br>6. පාසල් අධ්‍යාපනයට සෘජුවම බලපාන ආයතනවල කාර්ය මණ්ඩලවලට අයත් තැනැත්තන්ගේ දරුවන්<br>7. විදේශගත ව සිට පැමිණි තැනැත්තන්ගේ දරුවන් | |

(සම්මුඛ පරීක්ෂණයේ දී ඔබ විසින් සටහන් කරන ලකුණු ප්‍රමාණය ලිපිලේඛණවලින් සනාථ කළ යුතුය.)

07. ප්‍රකාශය :

මගේ ළමයා ඉගෙනීම පිණිස යම්කිසි රජයේ, පෞද්ගලික හෝ අනුමත හෝ පාසලකට දැනට නොයන බව මෙයින් ප්‍රකාශ කර සිටිමි. තව ද මෙහි ඉහතින් සඳහන් කරනු ලැබූ තොරතුරු සත්‍ය බවත්, මවිසින් මෙහි සඳහන් කළ ස්ථිර පදිංචිය පිළිබඳ සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කිරීමට එකඟ වන බවත් ප්‍රකාශ කරමි. මවිසින් සඳහන් කරන ලද යම් තොරතුරක් අසත්‍ය/ කූට බව හෙළි වුවහොත් මාගේ අයදුම් පත්‍රය ප්‍රතික්ෂේප කරනු ලබන බවත් මම දනිමි. ළමයා පාසලට ඇතුළත් කළ පසු තොරතුරු අසත්‍ය/ කූට බව හෙළිවුවහොත් ඔහු/ඇය පාසලෙන් ඉවත් කොට ගෙන අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් නම් කෙරෙන ප්‍රදේශයේ වෙනත් පාසලකට ඇතුළත් කිරීමට මම එකඟ වෙමි.

..............................................................................................
මවගේ/පියාගේ/නීත්‍යනුකූල භාරකරුගේ අත්සන

දිනය :...................................................

**උපලේඛන අංක 02**

<u>ගෘහමූලිකයන්ගේ දරුවන් තෝරා ගැනීමේ නිර්ණායකයන් හා ලකුණු ක්‍රමය</u>

1. පදිංචිය හා පදිංචි කාලය තහවුරු කිරීම

අවුරුදු 06 ක් හෝ ඊට වැඩි කාලයක් තුළ එම ස්ථාන යේ පදිංචි බව පහත ලේඛනවලින් සනාථ කල යුතු අතර ඒ සඳහා පහත අයුරින් ලකුණු දීම සිදුකෙරේ.

i. ස්ථිර පදිංචි ස්ථානයේ හිමිකම් සනාථ කෙරෙන ලිය කියවිලි/ ලිපිලේඛන (අයදුම්පත සමග යවන ලද ජායාපිටපතේ මුල් පිටපත) – ලකුණු 25

ii. ළමයාගේ උප්පැන්න සහතිකය (අදාළ ලිපිනය උප්පැන්න සහතිකයේ තිබිය යුතුයි) – ලකුණු 15

iii. පදිංචිය සනාථ කිරීම පිළිබඳ ප්‍රාදේශිය ලේකම් සහතික කළ ග්‍රාම නිලධාරි සහතිකය/ ජාතික හැඳුනුම්පත (අදාළ ලිපිනය ඇත්නම්) – ලකුණු 05

iv. ආසන්න අවුරුදු 6 තුළ වරිපනම්/ විදුලිබිල්පත් / ජල බිල්පත්/ දුරකථන බිල්පත්/ දෙමාපියන්ගේ විවාහ සහතිකය/ පදිංචි සනාථ කෙරෙන වෙනත් ලේඛන/ ගෙවීම් ලදුපත්/ ගෙවල් කුලී ලදුපත්/ දරුවාගේ සෞඛ්‍ය වාර්තා/ දරුවාගේ බැංකු ගිණුම් හෝ දරුවා පිළිබඳ වාර්තා – ලකුණු 03

v. දෙමව්පියන්ගේ පදිංචි කාලය තහවුරුවන බවට පිළිගත හැකි වෙනත් ලිය කියවිලි – ලකුණු 02

(උපරිම ලකුණු 50)

(අවශ්‍ය වුවහොත් පසුගිය වසර 6 තුළ මෙම ලිපිනයෙහි ඡන්ද නාම ලේඛණයේ දෙමාපියන්ගේ නම් ඇතුළත් වී තිබේද යන්න දරුවා තෝරා ගැනිමට පෙර පරික්ෂා කරනු ඇත.)

2. පදිංචි කාල සීමාව :

අවුරුදු 06 හෝ ඊට වැඩි කාලයක් සඳහා (ලකුණු 150)

අවුරුදු 06 සිට 05 දක්වා කාලයක් සඳහා (ලකුණු 90)
අවුරුදු 05 සිට 04 දක්වා කාලයක් සඳහා (ලකුණු 30)
(උපරිම ලකුණු 150)

3. පදිංචි ස්ථානයේ සිට පාසලට ඇති දුර :

පාසලේ සිට මීටර 001 – 500 තුළ (ලකුණු 60)
පාසලේ සිට මීටර 500 වැඩි – 1000 තුළ (ලකුණු 50)
පාසලේ සිට මීටර 1000 වැඩි – 1500 තුළ (ලකුණු 40)
පාසලේ සිට මීටර 1500 වැඩි – 2000 තුළ (ලකුණු 30)
පාසලේ සිට මීටර 2000 වැඩි – 2500 තුළ (ලකුණු 20)
පාසලේ සිට මීටර 2500 වැඩි – 3000 තුළ (ලකුණු 10)
පාසලේ සිට මීටර 3000 ට වැඩි (ලකුණු 05)
(උපරිම ලකුණු 60)

පාසලට ලැබී ඇති ඉල්ලුම්පත් හා පසුගිය අවුරුදුවල දුර සීමාවන් සැළකිල්ලට ගෙන තීරණය කරගන්නා දුර සීමාව කුඩා වූ විට එම සීමාව තුලම ළමයින් තෝරාගැනීමේ පහසුව සඳහා ඉහත සඳහන් මූලික ලකුණු දීමේපදනම සටහන් කරගනිමින් දුර පරාසයන් කුඩාකර ගත හැකිය. දුර පරාසයන් කුඩා වන විට ඊට සමානුපාතිකව ලකුණු ද වෙනස් විය යුතුය.

**නිදසුන් 1**

කිසියම් විදුහලක් දුර සීමාව මීටර 1500 තීරණය කරනු ලබන විට
පාසලේ සිට මිටර 001 – 500 තුළ (ලකුණු 60)
පාසලේ සිට මිටර 500 වැඩි – 1000 තුළ (ලකුණු 50)
පාසලේ සිට මිටර 1000 වැඩි –1500 තුළ (ලකුණු 40)

වශයෙන් ලකුණු දීම කල යුතුය.
(උපරිම ලකුණු 60)

එය තවදුරටත් පහසුකර ගැනීම සඳහා පහත සඳහන් පරිදි දුර පරාසයන් කුඩා කරගෙන ලකුණුද සමානුපාතිකව සකස් කර ගත

හැකිය.

පාසලේ සිට මීටර 001 – 250 තුළ (ලකුණු 60)
පාසලේ සිට මීටර 250 වැඩි – 500 තුළ (ලකුණු 56)
පාසලේ සිට මීටර 500 වැඩි – 750 තුළ (ලකුණු 52)
පාසලේ සිට මීටර 750 වැඩි – 1000 තුළ (ලකුණු 48)
පාසලේ සිට මීටර 1000 වැඩි – 1250 තුළ (ලකුණු 44)
පාසලේ සිට මීටර 1250 වැඩි – 1500 තුළ (ලකුණු 40) (උපරිම ලකුණු 60)

(ඉහත සඳහන් ලකුණු ලබා දීමේ ක්‍රම දෙකෙන් එක් ක්‍රමයක් පමණක් අනුගමනය කල යුතුය.)

අයදුම්කරුවන් සිය අයදුම්පතෙහි දුර පිළිබද මූලික ලකුණු දීමේ පදනම අනුව ලකුණු එකතු කර අවසාන ලකුණ දක්වනු ඇත. එහෙත් ඒ ඒ විදුහල් දුර පරාසයන් වෙනස් කරන විට ලකුණු ද සුළු වශයෙන් වෙනස් විය හැකිය. මේ නිසා සම්මුඛ පරීක්ෂණයට කැඳවන විටත් සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදීත් සිය දුර පරාස හා ලකුණු ප්‍රමාණයන් පිළිබඳව අයදුම්කරුවන් දැනුවත් කල යුතුය.

සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට පෙර කැඳවන ලිපියේම එම දුර පරාසයන් හා එම පරාසයට බැදියන ලකුණු දැක්වීමෙන් සම්මුඛ පරීක්ෂණයට එන අයදුම්කරු සුළුවෙන් වෙනස් වෙන ලකුණට අනුකූලව තම මුළු ලකුණු පිළිබදව දැනුවත්ව සිටිනු ඇත. එය විනිවිද භාවය සඳහා වඩාත් වැදගත් වේ.

(ලකුණු ක්‍රමයට අනුව ලකුණු සනාථ කිරීමට අදාළවන සියලු ලිපි ලේඛණ ඉදිරිපත් කල යුතුය.)

උපලේඛන අංක – 03

ආදි ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ දරුවන් තෝරා ගැනීමේ
<u>නිර්ණායක හා ලකුණු ක්‍රමය</u>

(මෙම ලකුණු ලබාදිය යුත්තේ ආදී ශිෂ්‍යභාවයට හිමිකම් කියන පාසලේ ම ලබා ගත් සුදුසුකම් හෝ ජයග්‍රහණය සඳහා පමණි. මව/පියා දෙදෙනා ම ආදි ශිෂ්‍ය/ශිෂ්‍යාවන් වන අවස්ථාවන්හි දී ඔවුන් දෙදෙනාට ම වෙන වෙන ම ලකුණු ලබා දී වැඩි ලකුණු ලබාගත් තැනැත්තාගේ ලකුණු පමණක් යොදා ගත යුතු ය.)

1. පාසලේ ඉගෙනුම ලැබූ කාලය ශ්‍රේණියකට ලකුණු 1 බැගින් - උපරිම ලකුණු 13

2. ශිෂ්‍යත්ව විභාගයෙන් සුදුසුකම් ලැබීම ( 5, / 7 ශ්‍රේණිය ) - ලකුණු 02 - උපරිම ලකුණු 02

3. අ.පො.ස.(සා..පෙළ) සමත්වීම (විෂයයන් 6ක් , මව්බස හා ගණිතය ඇතුළුව) ලකුණු 03
එයින් විශිෂ්ඨ සාමාර්ථ 4ක් හෝ 4ට වඩා ලබා තිබේනම් - ලකුණු 04 - උපරිම ලකුණු 04

4. අ.පො.ස.(උ.පෙළ) සමත්වීම (විෂයයන් 3ක් සමත්විය යුතුය.) - ලකුණු 06
විශ්ව විද්‍යාලයට ඇතුළත්වූයේ නම් - ලකුණු 12 - උපරිම ලකුණු 12

5. අන්තර් පාසල් විවාද/ප්‍රශ්න විචාරාත්මක/දැනුම මිනුම තරග
නායක - ලකුණු 03 /සාමාජික - ලකුණු 01 - උපරිම ලකුණු 06

6. විද්‍යාලයීය සමිති සමාගම් කටයුතු
පාසල් සංගම් සභාපති/ ලේකම්/ භාණ්ඩාගාරික - ලකුණු 03
උප සභාපති/උප ලේකම්/උප භාණ්ඩාගාරික - ලකුණු 02
කාරක සභික - ලකුණු 01 - උපරිම ලකුණු 06

7. පාසල් සෞන්දර්ය කටයුතු
නැටුම් /සංගීත (වාදන/ගායන) ආදී නියෝජනය - ලකුණු 02 - උපරිම ලකුණු 04

8. ශිෂ්‍යභට - (බාලක /බාලිකා) / තූර්ය වාදක (බාලක/බාලිකා)
ච□a - ලකුණු 06 □□a - ලකුණු 05
සැරයන් - ලකුණු 04 කෝප්‍රල් - ලකුණු 03 සාමාජික - ලකුණු 01 - උපරිම ලකුණු 06

9. බාලදක්ෂ/බාලදක්ෂිකා -
ජනාධිපති බාලදක්ෂ - ලකුණු 06, බාලදක්ෂ නායක - ලකුණු 05
බාලදක්ෂ උප නායක - ලකුණු 04, කාණ්ඩ නායක - ලකුණු 03
කාණ්ඩ උප නායක - ලකුණු 02, සාමාජික - ලකුණු 01
පෝතක බාලදක්ෂ 01 - උපරිම ලකුණු 06

10. තූර්යවාදක කණ්ඩායම් පෙර / අපරදිග

ජ්‍යෙෂ්ඨ නායක - ලකුණු 04, ජ්‍යෙෂ්ඨ සාමාජික - ලකුණු 02

කනිෂ්ට නායක - ලකුණු 02, සාමාජික - ලකුණු 01 - උපරිම ලකුණු 04

11. ශිෂ්‍ය නායක
ප්‍රධාන ශිෂ්‍ය නායක - ලකුණු 06 උප ප්‍රධාන ශිෂ්‍ය නායක - ලකුණු 04
ජ්‍යෙෂ්ට ශිෂ්‍ය නායක - ලකුණු 03 කනිෂ්ට ප්‍රධාන ශිෂ්‍ය නායක - ලකුණු 02
කනිෂ්ට උප ප්‍රධාන ශිෂ්‍ය නායක - ලකුණු 01
කනිෂ්ට ශිෂ්‍ය නායක - ලකුණු 01 - උපරිම ලකුණු 06

12. නේවාසිකාගාර ප්‍රධාන ශිෂ්‍ය නායක - ලකුණු 02
නේවාසිකාගාර ශිෂ්‍ය නායක - ලකුණු 01 - උපරිම ලකුණු 02

13. නිවාස නායක - ලකුණු 03
නිවාස උප නායක/නිවාස ක්‍රීඩා නායක (විවිධ ක්‍රීඩා) - ලකුණු 01 - උපරිම ලකුණු 03

14. ජාතික මට්ටමේ නව නිපයුම්කරුවන් - 1 වන ස්ථානය - ලකුණු 03
2 වන ස්ථානය - ලකුණු 02
3 වන ස්ථානය - ලකුණු 01 - උපරිම ලකුණු 03

15. පාසල් කාලය තුළ දී විද්‍යාලයීය තලයේ මුද්‍රිත සඟරා සංස්කරණය, පොත් ලිවීම හා මුද්‍රණය
කර ප්‍රකාශයට පත් කිරීම (ලේඛක/සංස්කාරක මණ්ඩලයේ සාමාජිකයින්ට) ලකුණු 02
- උපරිම ලකුණු 04

16. පාසල් ක්‍රීඩා කණ්ඩායම් නායක - ලකුණු 03,
පාසල් වර්ණ ලැබීම් - ලකුණු 02 සාමාජික - ලකුණු 01,
කනිෂ්ට කණ්ඩායම් නායක - ලකුණු 02, සාමාජික - ලකුණු 01

එක් ක්‍රීඩාවක් සඳහා උපරිම ලකුණු 03, උපරිම ක්‍රීඩාවන් 03, - උපරිම ලකුණු 09

17. විෂය සමගාමී ජයග්‍රහණ

අධ්‍යාපන අමාත්‍යාංශය මගින් සංවිධානය කරන විෂය සමගාමී තරග ජයග්‍රහණ (කේවල/යුගල/කණ්ඩායම්) එක් ඉසව්වක් සඳහා එක් තලයකින් පමණක් ලකුණු ලබා ගත හැකි ය.

| ලබාගත් ස්ථානය | පළමුවන | දෙවන | තුන්වන |
|---|---|---|---|
| පාසල් මට්ටමේ ජයග්‍රහණය | 2 | 1 | 1/2 |
| කොට්ඨාස මට්ටමේ ජයග්‍රහණ | 4 | 3 | 2 |
| කලාප මට්ටමේ ජයග්‍රහණ | 6 | 5 | 4 |
| පළාත් මට්ටමේ ජයග්‍රහණ | 8 | 7 | 6 |
| සමස්ත ලංකා මට්ටමේ ජයග්‍රහණ | 10 | 9 | 8 |
| සමස්ත ලංකා පාසල් වර්ණ-(ලකුණු 11) | - | - | - |

- උපරිම ලකුණු 20

18. පාසල හැර ගිය පසු ආදි ශිෂ්‍ය සංගමයේ සම්බන්ධතා
ආදි ශිෂ්‍ය සංගම් හි සාමාජිකත්වය අවුරුද්දකට ලකුණු 01 බැගින් ලකුණු 10
යාවජීව සාමාජිකත්වයට - ලකුණු 02 - උපරිම ලකුණු 12

19. ආදි ශිෂ්‍ය සංගමයේ දැරූ තනතුරකට - ලකුණු 02 - උපරිම ලකුණු 04

20. ආදි ශිෂ්‍ය සංගමයේ ක්‍රියාකාරී විධායක කමිටු සාමාජික අවුරුද්දකට ලකුණු 01 බැගින්
- උපරිම ලකුණු 03

21. ආදි ශිෂ්‍ය/ශිෂ්‍යාවන්ගේ පියා / මව ආදී ශිෂ්‍යයෙක්/ශිෂ්‍යාවක් නම් එක් අයෙකුට ලකුණු 01 බැගින් (අස්වීමේ සහතික මගින් මෙය සනාථ කළ යුතුයි.)
උපරිම ලකුණු 02

22. ආදි ශිෂ්‍ය/ශිෂ්‍යාව එම පාසලේ ම ස්ථිර සේවයෙහි යෙදී සිටීනම් හෝ යෙදී සිටියේ නම් ලකුණු 03
උපරිම ලකුණු 03

23. පාසලේ දියුණුව සඳහා දෙන ලද විවිධ ආකාරයේ සහයෝගය
1. පාසල වෙනුවෙන් ව්‍යාපෘති දායකත්වය - ලකුණු 03
2. පාසල් කටයුතු වෙනුවෙන් සහභාගීත්වය - ලකුණු 03
3. විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම - ලකුණු 03 - උපරිම ලකුණු 09

(ඉහත සඳහන් සියලු ම කරුණු පිළිගත හැකි සහතික මගින් සනාථ කළ යුතු යි. නිරවද්‍යතාව විදුහලේ පවත්වා ගෙන යනු ලබන ලේඛන මගින් තහවුරු කර ගත යුතු අතර තෝරා ගැනීමේ නිර්ණායක හා ලකුණු ක්‍රමය ප්‍රසිද්ධියේ භාවිත කොට තෝරා ගැනීම සාධාරණ ව සිදු වූ බව පෙනෙන්නට තිබිය යුතු ය.)

උපලේඛන අංක 04

පාසල් අධ්‍යාපනය ලබන සිසු සිසුවියන්ගේ සහෝදර සහෝදරියන්

*තෝරා ගැනීමේ නිර්ණායක හා ලකුණු ක්‍රමය*

1. ආසන්නතාව -
පළමුවන ශ්‍රේණියට සිසුන් ඇතුළත් කිරීම සඳහා වූ
1.1 පාසලේ සිට කි.මී. 1/2ක් ඇතුළත සිටී නම් ලකුණු 20
1.2 පාසලේ සිට කි.මී. 1/2 සිට 1ක් ඇතුළත සිටී නම් ලකුණු 18
1.3 පාසලේ සිට කි.මී. 1 සිට 2ක් ඇතුළත සිටී නම් ලකුණු 16
1.4 පාසලේ සිට කි.මී. 2 සිට 3ක් ඇතුළත සිටී නම් ලකුණු 12
1.5 පාසලේ සිට කි.මී. 3 සිට 4ක් ඇතුළත සිටී නම් ලකුණු 08

1.6 පාසලේ සිට කි.මී. 4 සිට 5ක් ඇතුළත සිටී නම් ලකුණු 04

- උපරිම ලකුණු 20

2. පාසලේ සිටින සහෝදර/සහෝදරියන් -

මේ සඳහා ලකුණු ලබාදීමේ දී පාසලේ ඉගෙනුම ලබන සහෝදර/සහෝදරියන් සංඛ්‍යාව කොපමණ වුව ද ලකුණු ලබා දිය යුත්තේ ඉන් එක් අයකු සඳහා පමණි. එසේ ලකුණු ලබා දීමේ දී ඔහු/ඇය එම පාසලේ ගතකළ එක් ශ්‍රේණියක් වෙනුවෙන් එක ලකුණක් බැගින් ලබා දිය යුතු යි.

- උපරිම ලකුණු 13කි

3. පාසලේ සිටින සහෝදර/සහෝදරියන් පාසලට ලබාදී ඇති ජයග්‍රහණ -

අධ්‍යාපන අමාත්‍යාංශය මගින් සංවිධානය කරන විෂය සමගාමී තරග ජයග්‍රහණ (කේවල/කණ්ඩායම්) එක් ඉසව්වක් සඳහා එක් තලයකින් පමණක් ලකුණු ලබා ගත හැකි ය.

| ලබාගත් ස්ථාන | පළමුවන | දෙවන | තුන්වන |
|---|---|---|---|
| පාසල් මට්ටමේ ජයග්‍රහණ | 2 | 1 | 1/2 |
| කොට්ඨාස මට්ටමේ ජයග්‍රහණ | 4 | 3 | 2 |
| කලාප මට්ටමේ ජයග්‍රහණ | 6 | 5 | 4 |
| පළාත් මට්ටමේ ජයග්‍ර හණ | 8 | 7 | 6 |
| සමස්ථ ලංකා මට්ටමේ ජයග්‍රහණ | 10 | 9 | 8 |
| සමස්ථ ලංකා පාසල් වර්ණ - ලකුණු 11 | - | - | - |

- උපරිම ලකුණු 20

4. පාසලේ දියුණුව සඳහා පාසලට ඇතුළත්වීමට බලාපොරොත්තු වන ළමයාගේ දෙමාපිය/ නීත්‍යානුකූල භාරකරුවන් විසින් පාසලට දක්වන ලද විවිධ ආකාරයේ සහයෝගය. - උපරිම ලකුණු 03

(මෙම ලකුණු ක්‍රමයට අදාළ වන ලිපිලේඛන අනිවාර්යයෙන්ම ඉදිරිපත් කළ යුතු ය)

**උපලේඛන අංක 05**

ස්ථාන මාරුවීම් ලැබ පාසල පිහිටි ප්‍රදේශයේ වාසය කිරීම සඳහා පැමිණි රජයේ නිලධරයන්ගේ දරුවන් සහ රාජකාරි කටයුතු නිසා තම පෞද්ගලික වාසස්ථානයෙන් බැහැර ව වාසය කිරීමට සිදුවන පාර්ලිමේන්තුවට හා පළාත් සභාවලට තේරී ඇති නියෝජිතයන්ගේ දරුවන් තෝරා ගැනීමේ නිර්ණායක හා ලකුණු ක්‍රමය

(ලකුණු ලබාදිය යුත්තේ රජයේ අවශ්‍යතාව මත ස්ථාන මාරුවීම් ලබා ගත් අයට පමණි.)

01. මව්පියන් මාරුවීම් ලැබ පැමිණ පදිංචි වූ ස්ථානයේ සිට පාසලට ඇති දුර :
- i. පාසලේ සිට මීටර 500ක් ඇතුළත සිටී නම් (ලකුණු 20)
- ii. පාසලේ සිට මීටර 500 වැඩි හා 1000ක් ඇතුළත සිටී නම් (ලකුණු 16)
- iii. පාසලේ සිට මීටර 1000 වැඩි හා 2000ක් ඇතුළත සිටී නම් (ලකුණු 12)
- iv. පාසලේ සිට මීටර 2000 වැඩි හා 3000 ක් ඇතුළත සිටී නම් (ලකුණු 08)
- v. මීටර 3000 ට වැඩි අධ්‍යාපන කලාපය තුළ (ලකුණු 04)

- උපරිම ලකුණු 20

02. පාර්ලිමේන්තු/ පළාත් සභා මන්ත්‍රී (ලකුණු 20)
මව, පියා දෙදෙනාම මාරුවීම් ලබා පැමිණ ඇත්නම් (ලකුණු 10)
මව/ පියා පමණක් මාරුවීම් ලබා පැමිණ ඇත්නම් (ලකුණු 05)

- උපරිම ලකුණු 20

03. තම සේවය අලුත් සේවා ස්ථානයට ඇතිකරන බලපෑම
අත්‍යාවශ්‍යයි ලකුණු 05
අවශ්‍යයි ලකුණු 02

- උපරිම ලකුණු 05

04. පෙර සේවා ස්ථානය හා මාරුවීම් ලැබ පැමිණ සේවා ස්ථානය අතර දුර

කි.මී. 200 ට වැඩි - ලකුණු 08
කි.මී. 200 - 150 - ලකුණු 06
කි.මී. 150 - 100 - ලකුණු 04
කි.මී. 100 - 50 - ලකුණු 02
කි.මී. 50 - 25 - ලකුණු 01
කි.මී. 25 ට අඩු - ලකුණු 00 - උපරිම ලකුණු 08

(ස්ථාන මාරුවීම් ලිපිය, වැඩභාරගත් ලිපිය, ආයතන ප්‍රධානියාගේ සේවා සහතිකය හා පදිංචිය සහතික කිරීම,පදිංචිය සනාථකිරීම සඳහා අදාළ ලිපිලේඛණ, පෙර සේවා ස්ථානයේ ලිපිලේඛන ආදී අදාලවන සියලුම ලිපිලේඛන දෙමාපියන් විසින් ඉදිරිපත් කළ යුතු ය.)

**උපලේඛන අංක 06**

<u>ගෘහ මූලික නොවන තැනැත්තන්ගේ දරුවන් සඳහා තෝරා ගැනීමේ නිර්නායකයන් හා ලකුණු ක්‍රමය :</u>

1. පදිංචිය හා පදිංචි කාලය තහවුරු කිරීම

අවුරුදු 06ක් හෝ ඊට වැඩි කාලයක් තුළ එම ස්ථාන යේ පදිංචි බව පහත ලේඛනවලින් සනාථ කළ යුතු අතර ඒ සඳහා

පහත අයුරින් ලකුණු දීම සිදුකෙරේ.

i. ස්ථිර පදිංචි ස්ථානයේ හිමිකම් සනාථ කෙරෙන ලිය කියවිලි/ ලිපිලේඛන - ලකුණු 25
(අයදුම්පත සමඟ යවන ලද ජායා පිටපතේ මුල්පිටපත)
ii. ළමයාගේ උප්පැන්න සහතිකය (අදාළ ලිපිනය උප්පැන්න සහතිකයේ තිබිය යුතු යි) - ලකුණු 15
iii. පදිංචිය සනාථ කිරීම පිළිබඳ ප්‍රාදේශිය ලේකම් සහතික කළ ග්‍රාම නිලධාරි සහතිකය/
ජාතික හැඳුනුම්පත (අදාළ ලිපිනය ඇත්නම්) - ලකුණු 05
iv. ආසන්න අවුරුදු 6 තුළ වරිපනම්/ විදුලිබිල්පත් / ජල බිල්පත්/ දුරකථන බිල්පත්/
දෙමාපියන්ගේ විවාහ සහතිකය/ පදිංචි සනාථ කෙරෙන වෙනත් ලේඛන/ ගෙවීම් ලදුපත්/
ගෙවල් කුලී ලදුපත්/ දරුවාගේ සෞඛ්‍ය වාර්තා/ දරුවාගේ බැංකු ගිණුම් හෝ දරුවා
පිළිබඳ වාර්තා -ලකුණු 03
v. දෙමාපියන්ගේ පදිංචි කාලය තහවුරු වන බවට පිළිගත හැකි වෙනත් ලිය කියවිලි -ලකුණු 02

(උපරිම ලකුණු 50)

(අවශ්‍ය වුවහොත් පසුගිය වසර 6 තුළ මෙම ලිපිනයෙහි ජන්ද නාම ලේඛනයේ දෙමාපියන්ගේ නම් ඇතුළත් වී තිබේද යන්න තෝරා ගැනිමට පෙර පරික්ෂා කරනු ඇත.

4. පදිංචි කාල සීමාව :
අවුරුදු 06 හෝ ඊට වැඩි කාලයක් සඳහා (ලකුණු 150)
අවුරුදු 06 සිට 05 දක්වා කාලයක් සඳහා (ලකුණු 90)
අවුරුදු 05 සිට 04 දක්වා කාලයක් සඳහා (ලකුණු 30)

(උපරිම ලකුණු 150)

5. පදිංචි ස්ථානයේ සිට පාසලට ඇති දුර :

පාසලේ සිට මීටර 001 වැඩි - 500 තුළ (ලකුණු 60)
පාසලේ සිට මීටර 500 වැඩි - 1000 තුළ (ලකුණු 50)
පාසලේ සිට මීටර 1000 වැඩි - 1500 තුළ (ලකුණු 40)
පාසලේ සිට මීටර 1500 වැඩි - 2000 තුළ (ලකුණු 30)
පාසලේ සිට මීටර 2000 වැඩි - 2500 තුළ (ලකුණු 20)
පාසලේ සිට මීටර 2500 වැඩි - 3000 තුළ (ලකුණු 10)
පාසලේ සිට මීටර 3000 ට වැඩි තුළ (ලකුණු 05)

(උපරිම ලකුණු 60)

පාසලට ලැබී ඇති ඉල්ලුම්පත් හා පසුගිය අවුරුදුවල දුර සීමාවන් සැලකිල්ලට ගෙන තීරණය කරගන්නා දුර සීමාව කුඩා වු විට එම සීමාව තුළ ම ළමයින් තෝරා ගැනීමේ පහසුව සඳහා ඉහත සඳහන් මූලික ලකුණු දිමේ පදනම සටහන් කරගනිමින් දුර පරාසයන් කුඩාකර ගත හැකීය. දුර පරාසයන් කුඩා වන විට ඊට සමානුපාතික ව ලකුණු ද වෙනස්විය යුතුය.

**නිදසුන් 1**

කිසියම් විදුහලක් දුර සීමාව මීටර 1500 තීරණය කරනු ලබන විට
පාසලේ සිට මීටර 001 - 500 තුළ (ලකුණු 60)

පාසලේ සිට මීටර 500 වැඩි - 1000 තුළ (ලකුණු 50)
පාසලේ සිට මීටර 1000 වැඩි -1500 තුළ (ලකුණු 40)
වශයෙන් ලකුණු දීම කල යුතුය.

(උපරිම ලකුණු 60)

එය තවදුරටත් පහසුකර ගැනීම සඳහා පහත සඳහන් පරිදි දුර පරාසයන් කුඩා කරගෙන ලකුණුද සමානුපාතිකව සකස් කර ගත හැකිය.

පාසලේ සිට මීටර 001 - 250 තුළ (ලකුණු 60)
පාසලේ සිට මීටර 250 වැඩි - 500 තුළ (ලකුණු 56)
පාසලේ සිට මීටර 500 වැඩි - 750 තුළ (ලකුණු 52)
පාසලේ සිට මීටර 750 වැඩි - 1000 තුළ (ලකුණු 48)
පාසලේ සිට මීටර 1000 වැඩි - 1250 තුළ (ලකුණු 44)
පාසලේ සිට මීටර 1250 වැඩි - 1500 තුළ (ලකුණු 40) (උපරිම ලකුණු 60)

(ඉහත සඳහන් ලකුණු ලබා දීමේ ක්‍රම දෙකෙන් එක් ක්‍රමයක් පමණක් අනුගමනය කළ යුතු ය.)

අයදුම්කරුවන් සිය අයදුම්පතෙහි දුර පිළිබඳ මූලික ලකුණු දීමේ පදනම අනුව ලකුණු එකතු කර අවසාන ලකුණ දක්වනු ඇත. එහෙත් ඒ ඒ විදුහල් දුර පරාසයන් වෙනස් කරන විට ලකුණු ද සුළු වශයෙන් වෙනස් විය හැකිය. මේ නිසා සම්මුඛ පරීක්ෂණයට කැඳවන විටත් සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදීත් සිය දුර පරාස හා ලකුණු ප්‍රමාණයන් පිළිබඳව අයදුම්කරුවන් දැනුවත් කල යුතුය.

සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට පෙර කැඳවන ලිපියේම එම දුර පරාසයන් හා එම පරාසයට බැඳි යන නිශ්චිත ලකුණු දැක්වීමෙන් සම්මුඛ පරීක්ෂණයට එන අයදුම්කරු සුළු වශයෙන් වෙනස් වන ලද ලකුණට අනුකූල ව තම මුළු ලකුණු පිළිබඳ ව දැනුවත් ව සිටිනු ඇත. එය විනිවිද බව සඳහා වඩාත් වැදගත් වේ.

(ලකුණු ක්‍රමයට අනුව ලකුණු සනාථ කිරීමට අදාළ වන සියලු ලිපි ලේඛන ඉදිරිපත් කළ යුතු ය.)

**උපලේඛන අංක 07**

පාසල් අධ්‍යයනයට සෘජු ව ම බලපාන ආයතනවල කාර්ය මණ්ඩලවලට අයත් තැනැත්තන්ගේ

<u>දරුවන් තෝරා ගැනීමේ නිර්ණායක හා ලකුණු ක්‍රමය</u>

(මව/ පියා දෙදෙනාම මෙම ගණයට අයත්නම් ඔවුන් දෙදෙනාටම වෙන වෙනම ලකුණු ලබාදී වැඩි ලකුණු ලබා ගත් අයගේ ලකුණු පමණක් යොදාගත යුතුය.)

1. පාසල් අධ්‍යාපනයට සෘජු ව ම බලපාන ආයතනයක කාර්ය මණ්ඩලයේ ස්ථිර සේවකයෙකු ලෙස සේවා කාලය - පූර්ණ වර්ෂයකට ලකුණු 01 බැගින්

   උපරිම ලකුණු 20

2. පදිංචි ස්ථානයේ සිට පාසල් අධ්‍යාපනයට සෘජු ව ම බලපාන ආයතනයේ දුර
   i. පදිංචි පළාතෙන් පිට දුෂ්කර පාසලක/ ආයතනයක (දැනට/ පෙර) පූර්ණ වර්ෂයකට ලකුණු 04 බැගින් — උපරිම ලකුණු 20
   ii. පදිංචි පළාතෙන් පිට දුෂ්කර නොවන පාසලක / ආයතනයක - පූර්ණ වර්ෂයකට ලකුණු 03 බැගින් — උපරිම ලකුණු 15
   iii. පදිංචි පළාත තුළ කි.මී.50 ට වැඩි දුර පාසලක / ආයතනයක - පූර්ණ වර්ෂයකට ලකුණු 02 බැගින් — උපරිම ලකුණු 10
   iv. පදිංචි පළාත තුළ සිට කි.මී. 25 - 50 දුර පාසලක / ආයතනයක - පූර්ණ වර්ෂයකට ලකුණු 01 බැගින් — උපරිම ලකුණු 05

   (ලකුණු දීමේ දී එක් ශීර්ෂයකට පමණක් ලකුණු දීම කල යුතුවේ.)

3. ඉල්ලුම් කරන පාසලේ සේවය කරන අයගේ සේවා කාලය අවුරුදු 03 හෝ ඊට වැඩිනම්
(වසර 03ට අඩුනම් ලකුණු නොදිය යුතුය) - ලකුණු 03 උපරිම ලකුණු 03

4. දරුවා ඇතුළත් කර ගැනීමට ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට පෙර වසර 05 ක් සඳහා ලබානොගත් නිවාඩු සඳහා - දින 10 ට ලකුණු 01 බැගින්
උපරිම ලකුණු 20

5. අධ්‍යාපන පද්ධතියට බලපාන අළුතින් හඳුන්වා දුන් නිර්මාණයන් සඳහා
- ලකුණු 05 උපරිම ලකුණු 05

6. දරුවා ඇතුළත් කරගැනීමට ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට පෙර වසර 5 ක කාලය තුළ පාසලක යෙදී ඇති විෂය සමගාමී ක්‍රියා සඳහා
වසරකට විෂය සමගාමී ක්‍රියා එකකට ලකුණු 1 බැගින් උපරිම ලකුණු 05

(ලකුණු ක්‍රමයට අනුව ලකුණු සනාථ කිරීමට අදාළවන සියලු ලිපි ලේඛන ඉදිරිපත් කල යුතු ය. දුෂ්කර පාසලක රාජකාරි කර ඇත්නම් අදාළ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ සහතික කළ යුතු ය)

උපලේඛන අංක 08

විදේශගත ව සිට පැමිණි තැනැත්තන්ගේ දරුවන්
තෝරා ගැනීමේ නිර්ණායක හා ලකුණු ක්‍රමය

(මෙම ගණය යටතේ ලකුණු ලබා දිය යුත්තේ දරුවා සමඟ විදේශගතව සිටියහොත් පමණි)

1. මව/ පියා/ නීත්‍යනුකූල භාරකරු සමඟ දරුවා විදේශගත ව සිටි කාලය. ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට පෙරාතුව වූ
   i. ආසන්න වසර 03 ක් හෝ ඊට වැඩි (ලකුණු 10)
   ii. ආසන්න වසර 02 - 03 දක්වා (ලකුණු 06)
   iii. ආසන්න වසර 01 - 02 දක්වා (ලකුණු 03)

උපරිම ලකුණු 10

2. විදේශ ගත වූ ස්වභාවය
   i. ශ්‍රී ලංකා රජයේ දූත මණ්ඩල රාජකාරියේ නිරත ව (ලකුණු 10)
   ii. ශ්‍රී ලංකා රජයේ අවශ්‍යතා සඳහා (ලකුණු 08)
   iii. ශිෂ්‍යත්වයක් ලබා (ලකුණු 06)
   iv. පෞද්ගලික අවශ්‍යතා මත (ලකුණු 04)

උපරිම ලකුණු 10

3. පදිංචි වූ ස්ථානයේ සිට පාසලට ඇති දුර :
   i. කි. මීටර 1ක් ඇතුළත සිටි නම් (ලකුණු 10)
   ii. කි. මීටර 1 -3ක් ඇතුළත සිටි නම් (ලකුණු 08)
   iii. කි. මීටර 3 -5ක් ඇතුළත සිටි නම් (ලකුණු 06)
   iv. කි. මීටර 5 ට වැඩි (ලකුණු 04)

උපරිම ලකුණු 10

(මෙය සනාථ කරගැනීම සඳහා විදේශ ගමන් බලපත්‍ර, වීසා, සේවය කරන ලද ස්ථානය පිළිබඳ ලියවිලි, අධ්‍යාපන සහතික, පත්වීමේ ලිපිය, දරුවා විදේශගත වූ බවට ලියවිලි ආදී ඉදිරිපත් කළ යුතු ය. පදිංචි සනාථ කරන ලිය කියවිලිද රැගෙන ආ යුතු ය.)

*උපලේඛන අංක 11*

<u>ප්‍රතික්ෂේප වූ බව දන්වන ලිපියේ ආකෘතිය</u>

විදුහල :......................................................................................
ලිපිනය .......................................................................................
දිනය ..........................................................

.............................................................................................. මයා/මිය,
..............................................................................................,
..............................................................................................

**පළමු ශ්‍රේණියට ළමයින් ඇතුළත් කිරීම - 200..**

ළමයා අයත් ගණය :............................................................................................................

එම ගණය යටතේ ඇතුළත් කිරීමට තීරණය වූ අවම ලකුණ :......................................

මෙම දරුවා ලබාගත් ලකුණු :..........................................................................................................

මෙම ගණය යටතේ තීරණය වූ අවම ලකුණට වඩා අඩු ලකුණු ලබාගත් නිසා, ඔබ දරුවා වන ............................................................................................... ඇතුළත් කර ගැනීමට තේරී නැති බව කණගාටුවෙන් දන්වමි. වෙනත් පාසලක් ලබා ගැනීම සඳහා ...................................................... කලාප භාර අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත අලුත් අයදුම්පතක් ඉදිරිපත් කරන්න.

එම ලිපිනය : ........................................................................
........................................................................
..............................................................................

විදුහල්පති
නිල මුද්‍රාව

උපලේඛණය 12

**පාසල්වල 2 වන ශ්‍රේණියේ සිට 11 වන ශ්‍රේණිය දක්වා**
**(6 ශ්‍රේණිය හැර) පංතිවලට සිසුන් ඇතුළත් කිරීම සඳහා අයදුම් පත්‍රය**

**. . . . . . . . . . . . . . . . . . . . වර්ෂයේදී . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . විදුහලේ**
**. . . . . . . . . . . . . . ශ්‍රේණියට දරුවකු ඇතුළත් කිරීම සඳහා ඉල්ලුම්පත්‍රය**

දෙමව්පියන්/ නිත්‍යානුකූළ භාරකරු විසින් ආකෘති පත්‍රයේ අංක 01 සිට අංක 06 දක්වා සඳහන් සාමාන්‍ය තොරතුරු ඇතුළත් කොටස් සම්පූර්ණ කළ පසු අංක 07 සිට අංක 13 දක්වා කොටස්වලට ලබාගත හැකි ලකුණු ප්‍රමාණයන් පිළිබඳ නිර්ණායක සඳහන් කොට ඇත. ඒවා අතුරින් තමන්ට අදාළ නිර්ණායක ඉදිරියේ ඇති කොටුව මත √ ලකුණ සටහන් කරන්න. ලකුණු කර ඇති නිර්ණායකයට හිමි ලකුණු ප්‍රමාණය ඉදිරියෙහි ඇති ලකුණු සඳහන් කරන කොටුවේ සඳහන් කරන්න.
(සඳහන් කර ඇති ලකුණු සම්මුඛ පරීක්ෂණ අවස්ථාවෙහි අදාළ ලිපි ලේඛන වලින් සනාථ කළ යුතුයි.)

01. පදිංචිය වෙනස් වීම මත දරුවාට පාසලක් ඉල්ලුම් කරන සිසුවාගේ මව/ පියා/ නිත්‍යණුකූල භාරකරුගේ නම :-

02. පාසල ඉල්ලා සිටින සිසුවාගේ නම :-
   i. උපන් දිනය : අවු . . . . . මාස . . . . . . දින . . . . . .
   ii. ස්ත්‍රී/ පුරුෂ භාවය :- . . . . . . .
   iii. ඉගෙනුම ලබන මාධ්‍ය :- . . . . . .
   iv. ආගම :- . . . . . . . . . .

03. ඇතුළත් වීමට බලාපොරොත්තුවන පංතිය :-

04. පදිංචිය වෙනස් කිරීමට පෙර ඉගෙනුම ලැබූ පාසලේ නම හා ලිපිනය :-

05. නව පදිංචි ස්ථානයේ ලිපිනය :-

06. පදිංචිය වෙනස් වීමේ ස්වභාවය

ලකුණු

i. සේවා අවශ්‍යතාව මත ස්ථාන මාරුවීම් ලැබ පාසල පිහිටි ප්‍රදේශයේ වාසය කිරීම සඳහා පැමිණෙන රජයේ නිලධාරීන්/ සංස්ථා නිලධාරීන්/ රාජ්‍ය බැංකු නිලධාරීන් (ලකුණු 20)
(මෙයට රජයේ අවශ්‍යතාව මත කලත්‍රයා හා දරුවා සමග විදේශ ගත ව ☐ට නැවත මෙරටට පැමිණෙන නිලධරයන් ද සලකනු ලැබේ. )

ii. පෞද්ගලික අවශ්‍යතා මත ස්ථාන මාරු ලැබ පාසල පිහිටි ප්‍රදේශයේ වාසය කිරීම සඳහා පැමිණෙන රජයේ නිලධරයන්/ සංස්ථා නිලධාරීන්/ රජයේ බැංකු නිල☐රීන් (ලකුණු 10)

iii. ඉහත 1 හා 11 ට අදාළ නොවන විදේශයන් හි දෙවසරකට වැඩි කාලයක් කලත්‍රයා හා දරුවා සමඟ පදිංචි ව සිට පැමිණෙන ශ්‍රී ලංකිකයන් හා පාසල පිහිටි ප්‍රදේශයට සැබවින් ම තම ස්ථිර වාසස්ථානය වෙනස් කර පැමිණෙන දෙමාපියන්/ නීත්‍යානුකූල☐රකරුවන් (ලකුණු 05) ☐

07. කලත්‍රයා ද ඉහත 6 හි ඝ හෝ ඝඝ ට අයත් වනනේ නම් එම ලකුණු ප්‍රමාණය ඔහුට/ ඇයට ද හිමි වේ. ☐

08. රජයේ අවශ්‍යතා මත ස්ථාන මාරුවීමක් ලබා ඇති නම්, ඔබේ සේවයේ අලුත් සේවා ස්ථානයට ඇති බලපෑම

i. අත්‍යාවශ්‍යය (ලකුණු 20) ☐

ii. අවශ්‍ය (ලකුණු 08) ☐ ☐

(නව ආයතන ප්‍රධානියා විසින් සහතික කළ යුතුය) ☐

09. කලත්‍රයා ඉහත 06 හි ඝ ට අදාළ නම් 08 හි ඝ හෝ ඝඝ ට අදාළ ලකුණු ලබා දිය යුතු ය.
(ඉහත 06,07, 08 හා 09 ට අදාළ වන කරුණු නව ආයතන ප්‍රධානියා විසින් සහතික කළ යුතු යි) ☐

10. පෙර පදිංචි ස්ථානයේ සිට නව ස්ථානයට ඇති දුර ප්‍රමාණය

i. කි.මී. 50 - කි.මී. 100 (ලකුණු ☐4) ☐

ii. කි.මී. 100 - කි.මී. 200 (ලකුණු 06) ☐

iii. කි.මී. 200 ට වැඩි (ලකුණු 08) ☐ ☐

11. නව පදිංචි ස්ථානයේ සිට පාසලට ඇති දුර ප්‍රමාණය

i. කි.මී. 1 ට අඩු (ලකුණු 10) ☐

ii. කි.මී. 1 ට වැඩි කි.මී. 3 ට අඩු (ලකුණු 08) ☐

iii. කි.මී. 3 ට වැඩි කි.මී. 6 ට අඩු (ලකුණු 06) ☐

iv. කි.මී. 6 ට වැඩි කි.මී. 10 ට අඩු (ලකුණු 04) ☐ ☐

v. කි.මී. 10 ට වැඩි (ලකුණු 02) ☐

12. ඉල්ලුම්කරන පාසලට සිසුවාට ඇති සම්බන්ධතාව

i. මීට පෙර එම පාසලේ ඉගෙනුම ලබා ඇති නම් (ලකුණු 10) ☐

ii. දැනට එම සිසුවාගේ සහෝදර/ සහෝදරියන් එම පාසලේ ඉගෙනුම ලබන්නේ නම් (ලකුණු 05) ☐ ☐

13. ඉහත අංක 12 සඳහන් කවුරු හෝ (දරුවා/සහෝදර, සහෝදරියන්) එම පාසලට කීර්තියක් ලබා දී ඇති නම් (ලකුණු 03) ☐

14. ප්‍රකාශය :

ඉහත සඳහන් කරනු ලැබූ තොරතුරු සත්‍ය බව ද, එම තොරතුරු තහවුරු කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන ලිපි ලේඛණ සත්‍ය බව ද සහතික කරමි. මවිසින් සඳහන් කරන ලද යම් තොරතුරක් අසත්‍ය බව හෙළි වුවහොත් මගේ අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප කරනු ලබන බවත් මම දනිමි. ළමයා පාසලට ඇතුළත් කළ පසු එම තොරතුරු අසත්‍ය බව හෙළිවුවහොත් ඔහු/ඇය පාසලෙන් ඉවත් කර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් නම් කෙරෙන ප්‍රදේශයේ වෙනත් පාසලකට ඇතුළත් කිරීමට මම එකඟ වෙමි.

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
මව/පියා/ නීත්‍යනුකූල භාරකරුගේ අත්සන

දිනය : . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

උපලේඛන අංක 13

අ.පො.ස. (උ.පෙ.) පන්තිවලට සිසුන් ඇතුළත් කිරීම
සඳහා ලකුණුදීමේ ක්‍රමය

1. ආසන්නතාව

ඉල්ලුම්කරු පදිංචි ව සිටින ප්‍රදේශය අනුව ලකුණු ප්‍රදානය කෙරේ.

| | | ලකුණු |
|---|---|---|
| කොට්ඨාසය තුළ | – | 10 |
| කලාපය තුළ | – | 07 |
| දිස්ත්‍රික්කය තුළ | – | 05 |
| පළාත තුළ | – | 03 |
| පළාතෙන් පිටතට | – | 01 |

(උපරිම ලකුණු 10)

(ලකුණු දීමේ දී එක් ශීර්ෂයක් සඳහා පමණක් ලකුණු දීම කළ යුතු වේ.)

2. අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී ලැබූ ප්‍රතිඵල

එක් විශිෂ්ඨ සාමාර්ථයක් සඳහා (ැ) ලකුණු 06
එක් අධි සම්මාන සාමාර්ථයක් සඳහා ( ච් ) ලකුණු 05
එක් සම්මාන සාමාර්ථයක් සඳහා ( □ ) ලකුණු 04
එක් සාමාන්‍ය සාමාර්ථයක් සඳහා ( □) ලකුණු 02
අතිරේක විෂයයන් සඳහා එක් විෂයයකට ලකුණක් බැගින් විෂයයන් 2ක් සඳහා පමණක් ලකුණු ලබා දිය හැකි යි.

(උපරිම ලකුණු 50)

3. විෂය සමගාමී කටයුතු

මේ යටතේ එක් ශිෂ්‍යයකුට ලකුණු ලබා ගත හැක්කේ අධ්‍යාපන අමාත්‍යාංශය මගින් සංවිධානය/ අනුමත කර විෂය සමගාමී කටයුතු 3ක් සඳහා පමණි. ලකුණු දිය යුත්තේ ජාතික හෝ පළාත් යන මට්ටම් දෙකින් එක් මට්ටමකට පමණි.

| ලැබූ ස්ථාන | 1 වන ස්ථානය | 2 වන ස්ථානය | 3 වන ස්ථානය |
|---|---|---|---|
| ජාතික මට්ටම | ලකුණු 5 | ලකුණු 4 | ලකුණු 3 |
| පළාත් මට්ටම | ලකුණු 3 | ලකුණු 2 | ලකුණු 1 |

(උපරිම ලකුණු 15)

(ලකුණු ක්‍රමයට අනුව ලකුණු සනාථ කිරීමට අදාළ වන සියලු ම ලිපිලේඛන ඉදිරිපත් කළ යුතු ය)